# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිටපත් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 නවම් මස 03 වන බුද දින

■ 2015 පෙබරවාරි මස 03 වැනි අඟහරුවාදා



■ සෙබිසල් පිරිතෙහි දහම් පඬුරකි

■ විසිතුම් පදනා කොටස

# බුදුරදුන් වස් විසූ තැන්

බුදුරජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් පළමු වසරේ පටන් පරිනිර්වාණය දක්වා පන්සාලිස් වසරක් වස්සාන කාලයන්හි වස් විසූහ. එම වසර 45 න් වැඩි කාලයක් එනම් වසර 25 ක්ම සැවැත්නුවර ඇසුරු කොටගෙන වැඩ වාසය කළහ. ඉන් වසර 19 ක් අනාථපිණ්ඩික හෙවත් සුදත්ත සිටුවරයා කරවූ ජේතවනාරාමයෙහිද, වසර 6 ක් විශාඛා මහ උපාසිකාව කරවූ පූර්වාරාමයෙහිද වස් විසූ සේක.



### පළමුවන වස

ඇසළ පුර පෝදින බරණැස ඉසිපතනයේ මිගදාවේ, පස්වග තවුසන්ට දහම් දෙසීම, සඟ සසුනෙ ආරම්භය, පස්වග තවුසන් රහත්වීම, බුදුරදුන්ගේ පළමු ලංකාගමනය.

### දෙවන වස

රජගහනුවර වේළුවනාරාමයෙහි, බිම්බිසාර රජතුමා කරවූ වේළුවනාරාමය බුදුරදුන්ට පූජා කිරීම.

### තෙවන - සිවුවන වස

අනේපිඬු සිටුතුමා බුදුරදුන් බැහැදකීම, බුදුරජාණන් වහන්සේට සැවැත්නුවරට වඩින ලෙසට අනේපිඬු සිටුතුමා ආරාධනා කිරීම.

### පස්වන වස

විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහිදී කාන්තාවන්ට පැවිද්ද ලබාදීම, බුදුරදුන් දෙවන වරට ලක්දිව වැඩමවීම.

### සයවන වස

මකුල පර්වතයෙහි ඛේමා බිසව පැවිදි වීම.

### හත්වන වස

ගණ්ඩම්බ රුක් මුල යමා මහ පෙළහර පා තීර්ථකයන් දමනය කිරීම හා ඒ සමගම දෙව්ලොවට වැඩ තව්තිසා භවනයෙහි වස් වැසීම, මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කිරීම, මෛත්‍රී බෝසතාණෝ පැවිදි වීම.

### අටවන වස

සුංසුමාරගිරි අසල භේසකලා වනයෙහි බෝධිරාජකුමරු පැවිදි වීම, සුනාපරන්ත දේශයේ පුණ්ණ පැවිදිව සුනාපරන්තයට යාම, බුදුරදුන්ද සුනාපරන්තයට වැඩම කරවීම, නර්මදා නදී තීරයෙහි බුදු සිරිපා සලකුණු තැබීම, මණිඅක්ඛික නා රජුගේ ආරාධනාවෙන් බුදුරදුන් තෙවෙනි වරට ලක්දිවට වැඩම කරවීම, කැලණියේදී සුමන සමන් දෙවිඳුගේ ඇරයුමෙන් සමන්ත කූටයට වැඩම කොට සිරිපා ලකුණ තැබීම.

### නවවැනි වස

බුදුරදුන් කොසඹෑ නුවරට වැඩම කරවීම, මාගන්දිය බමුණා පැවිදි වීම, සංඝ භේදය, විනයධර, ධර්මධර භික්ෂූන්ගේ කලහය නිසා බුදුරදුන් පිරිස අතහැර හුදෙකලාව වනගත වීම.

### දසවැනි වස

බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩම කොට එහි වස් විසීම, ඇතෙකු හා වඳුරෙකුගේ උපස්ථානය ලැබීම.

### එකොළොස්වැනි වස

දක්ඛිණා ගිරියෙහි ඒකනාලා නම් බමුණු ගමෙහි වස් විසීම, සිවුරු කඩ කැපීමට නියම කිරීම.

### දොළොස්වැනි වස

වේරංජා නුවර උදය බමුණාගේ ආරාධනාවෙන් එහි වස් විසීම, ආහාර හිඟ වීමෙන් බුදුරදුන්ට යව ආහාරය වැළඳීමට සිදුවීම.

### තෙළෙස්වැනි වස

චාලිය පර්වතයෙහි

### තුදුස්වැනි වස

සැවැත්නුවර ජේතවනාරාමයෙහි, රාහුල තෙරුන් උපසම්පදාව ලැබීම.

### පසළොස්වැනි වස

කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි

### දහසයවැනි වස

අළව් රට අලව්ක යක්ෂයා දමනය කිරීම.

### දහහත්වැනි වස

රජගහනුවර වේළුවනාරාමයෙහි සිරිමා මළසිරුර අරමුණු කර දහම් දෙසීම.

### දහඅටවැනි වස

චාලිය පර්වතයෙහි පේෂකාර දුවට දහම් දෙසීම.

### විසිවන වස

රජගහනුවර වේළුවනාරාමයෙහි

### විසිඑක්වන වස

ස්ථිර උපස්ථායකයකු ලෙස ආනන්ද හිමි පත්කර ගැනීම, විශාඛා උපාසිකාවගේ පූර්වාරාම පූජාව, ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය, සුදින්න තෙරුන්ට ප්‍රථම පාරාජිකා ශික්ෂාපදය පැනවීම (ආඥා ප්‍රාතිමෝක්ෂ), ආනන්ද බෝධි රෝපණය, අංගුලිමාල දමනය, කොසොල් රජුගේ අසදෘශ මහා දානය.


### විසිදෙවන වස සිට හතළිස් හතරවැනි වස

බුදුරදුන් සැවැත්නුවර ජේතවනාරාමයෙහි හා පූර්වාරාමයෙහි වස් විසීම.

### හතළිස් පස්වන වස

බේලුවගම් බුදුරදුන් චාපාල චෛත්‍යයේදී "ආයු සංස්කාරය" හැරීම - සම්බුද්ධ පරිනිර්වාණය සිදුවීම.

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# මාරයාවත් පරදමු

සම්බුද්ධ ශාසනයේ මාරයා පිළිබඳ කතා බොහෝය. බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූයේද මාරයා පරාජය කරමිනි. ලොව කිසි පුද්ගලයකු විසින් ජයගත් දරුණුම හා භයානකම සටන මාර යුද්ධයයි. බුදුන් වහන්සේ හමුවේ තමන්ට ජයගන්නට නොහැකි වූවද මාරයා රහතුන් වහන්සේලාට විවිධ හිරිහැර කරදර පැමිණවූ අවස්ථාද ශාසනික කරුණු තුළින් අසන්නට ලැබේ.

මුදු සසුනෙහි සෘද්ධි බලයෙන් අගතැන්පත් මහා මුගලන් මහ රහතන් වහන්සේට මාරයාගෙන් නිතර හිරිහැර සිදුවිය. මහා මුගලන් රහතන් වහන්සේට දෙව්ලොව මෙන්ම අපායටද වැඩම කිරීමටත්, එහි තතු දැක බලාගෙන ඒවා ලෝකවාසීන්ට දේශනා කිරීමටද හැකියාව තිබුණි. එසේම විවිධාකාර ප්‍රේතයන්, අමනුෂ්‍යයන් මුණ ගැසී ඔවුන් සමග කතාබහ කිරීමටත්, ඔවුන් විඳින දුක හා එයට හේතු හඳුනා ගැනීමටත් හැකියාව තිබුණි. මෙතරම් බලසම්පන්න මුගලන් මහ රහතන් වහන්සේටද කරදර කර තමන් වෙත යළි නතුකර ගැනීමට සිතූ මාරයා අප රහතන් වහන්සේගේ ශරීරය තුළට ඇතුළු වී අභ්‍යන්තරයේ විවිධ වේදනාවන් ඇති කරන්නට විය. මුගලන් මහ රහතන් වහන්සේ තමාට මේ තරම් පීඩා දීමට හේතුව විමසා බලන විට මාරයාගේ ක්‍රියාවක් බව දුන එවිට මාරයා තම ශරීරයෙන් පිටතට ගෙන්වා ගත්හ. එසේ කැඳවා තමන්ගේ පූර්වකාලීන ආත්මයක් පිළිබඳ මාරයාට මෙසේ පැහැදිලි කරදුන්හ.

"එම්බා මාරය, නා දනගනුව... තට පෙර 'දූසි' නමින් ලෝකය පාලනය කළ මාර දිව්‍ය පුත්‍රයා මමය. මෙයට කල්ප ගණනාවකට පෙර 'දූසි' නම් වූ මට කාලි නමින් නැගණියක්ද සිටියා. ඇගේ පුතාගේ නම කාලය. ඒ කාල අනෙකකු නොව තෙපය. එබැවින් තමාට කරදර කරන්නේ කරුණු නොදනය. මටද තට මෙන්ම අදත් බලයක් ඇත. අද මගේ බලය හා ඉක්මවා යන්නේය..."

ඒ ඇසූ මාරයා බියට පත්ව පලා ගියේය. මේ මාරයාගේ නම 'කාල' නිසා මිනිසුන් මළ විට 'කාලක්‍රියා' කළ බව කියනු ලබන්නේ මාරයාගේ නමද එයටද ඇතුළත් වන පරිදිය.

මේ අන්දමින් දිනක් උත්පලවණ්ණා මහ තෙරණින් වහන්සේටද කරදර කිරීමට මාරයා පැමිණියේය. එදින උත්පලවණ්ණා මහ තෙරණින් වහන්සේ වනයෙහි භාවනා කරමින් සිටියහ. මේ අවස්ථාවේ එහි එළඹි මාරයා උත්පලවණ්ණා තෙරණින් වහන්සේගේ තාරුණ්‍යය හා රූපසපුව පිළිබඳ වර්ණනා කළේය.

"මෙතරම් රූපත් තරුණියක වන ඔබ මෙසේ වනයෙහි දුක් විඳින්නේ කුමන පාපයක් නිසාද? ඔබට කොතරම් සැප සම්පත් විඳින්නට හැකි තරුණියක්ද? මේ තරම් අවාසනාවන්ත ලෙස වනයෙහි දුක් විඳිනවාට වඩා නගරයට ගොස් සැපවත් හා යහපත් යුග දිවියක් ආරම්භ කොට ජීවිතය ගත කිරීමට මොනතරම් හැකියාවක් තිබේද? කුමරිය මෙයින් මිදී නගරයට ආපසු යන්න" යැයි ආරාධනා කරමින් මාරයා ඇගේ සිත වෙනස් කිරීමට වෙහෙස ගත්තේය.

මෙය ඇසූ උත්පලවණ්ණා මහ තෙරණින් වහන්සේ 'මාරය... තුඹ මහා බලවන්තයෙක් කියා තුඹ සිතනවා විය හැකිය. එහෙත් තුඹ මට බලවතෙක් හෝ දුවන්තයෙක් හෝ නොවේ. තුඹ මගේ ඇහි බැම තුළ සඟවා ගත හැකි බලයක් මට තියෙනවා. ඒ නිසා තුඹගේ මිය බෙල් වදන්වලින් මට එළක් නැත. තවදුරටත් හේතු නොදක්වා ඉවත්ව යනු. නොඑසේ නම් මා ඔබ කිසිවක් කරගත නොහැකි ලෙස ඔබගේ ඇසි පිය තුළ සිර කර තබමි" යි කීහ.

මේ ඇසූ මාරයා අතිශය බියට පත්විය. නැවත උත්පලවණ්ණා මහ තෙරණින් වහන්සේට කරදර නොකළේය.

මේ අනුව පැහැදිලි වන්නේ නිවැරදි අධිෂ්ඨානය තුළින් රහත් භාවය ලබාගත් විට මාරයාට පවා ඊයක් නොමැතිව තමන් ලද සුවයේ සුවය විඳගත හැකි බවය.

**බණ්ඩාර ඇකිරියගල - කෑගල්ල**

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



# ඉපදීම සතුටක්ද දුකක්ද?

● අංගුලිමාල තම දෑතින් මහා මිනිස් ඝාතනයක් කරලත් සසරින් එගොඩ වුණා.

● පටාචාරා සිහිය විකල් වන තරම් අනාථ අසරණ ජීවිත තත්ත්වයකට පත්වෙලත් සසරින් එගොඩ වුණා.

● සුනීත වගේ පිළිගැනීමට අනුව කිසිදු වරප්‍රසාදයක් නොලබන සමාජ පසුබිමක් සහිතව ඉපදිලාත් සසරින් එගොඩ වුණා.

● මළ මිනී කන සිවලුන්ට කා දමන්නට හැර දමා සිටි සෝපාකත් සසරින් එගොඩ වුණා.

● අම්බපාලි නගර සෝභිනියක් ලෙස කාමයෙහි ගැලී ඉඳලත් සසරින් එගොඩ වුණා.

● කසී භාරද්වාජ බමුණා, පිඬු සිඟා වැඩි බුදුරජාණන් වහන්සේට, "අනුන්ගෙන් යැපෙන්නේ නැතිව උපයාගෙන කන්න" යි දෝෂාරෝපණය කරලත් සසරින් එගොඩ වුණා.

බෞද්ධයකු විදියට ඔබ මේ සියලු කතා අසා තිබෙනවා නේද?

මේ කිසිවෙක් තමාට සිදුවූ දේ ගැන හෝ තමා කළ කී දේ ගැන හෝ පසුතැවිලි වෙමින් පමාවුණාද? නැහැ. කළ වැරදි අවතක කොට ඔවුන් නිර්වාණයට අවශ්‍ය දේ සම්පාදනය කරගත්තා. ඒ වාගේ අය නිර්වාණයට ළඟා වුණා නම්, අපට මාර්ග ඵල ලබන්නට හෝ නිර්වාණයට ළඟා වන්නට හෝ බැරි යැයි තීරණය කරන්නට ඔබට ඇති අයිතිය මොකක්ද? අපට ඇති දුකුම මොකක්ද? අපට ඇති ප්‍රඥාව මොකක්ද? අපට ඇති වගකීම මොකක්ද? ඒ සියලුම දෙනාට වඩා සමහර විට අප වරප්‍රසාද ලැබූවන් වන්නට ඇති.

ඒත් බුදු දහම හරිහැටි විමසා නොබලමින්, අප මෙන්න මෙහෙම දේ කියමින් කාලය ගත කරනවා නේද?

● අපට අද පිහිට වෙන්න බුදුහාමුදුරුවෝත් නැහැනේ.
● අපට අනේ රහත් වෙන්න පින නැහැනේ.
● මේ කාලේ මාර්ග ඵල ලබන්න බැහැනේ.
● අපි ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ලබලා නැහැනේ.

ඒ වාගේම මෙන්න මේ කාරණාවත් සලකා බලන්න.

● බුදුරජාණන් වහන්සේ ඇසුරු කරමින් මාර්ග ඵල ලබා සිටි මුත්, අරහත් තත්ත්වයට පත් නොවූ විශාඛාව, ධම්මික සිටුවරයා සහ තවත් විශාල පිරිසක් දැන් දෙව් ලොව පහළ වී සිටිනවා.

● බුදුරජාණන් වහන්සේ ඇසුරු නොකළත්, ධ්‍යාන ලබා සිටි අසිත තවුසා, උද්දකරාමපුත්ත, ආලාරකාලාම ආදීන් දැන් බඹ ලොව පහළ වෙලා සිටිනවා.

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

● මිනිස් භවයක් ලබා ඉපදී බුදුරජාණන් වහන්සේ ඇසුරු කරන්නට ලැබුණත්, ඇසූ දහමට අනුගත වන්නට අසමත් වූ දේවදත්ත, අජාසත්ත, මාගන්දියා, චිංචිමානවිකා, සුප්පබුද්ධ, සුන්දරී ආදීන් අපායගත වෙලා අදත් එහි සිටිනවා.

අප ඉන්නේත්, ඒ අය ඉන්නේත්, මේ සසරේ ගමන් කරන සියලු සතුන් අතරේමයි. දෙවියන්, බඹුන්, මනුෂ්‍යයන්, තිරිසනුන්, ප්‍රේතයන් ආදී කවරකු වුවත් ඉපදීම සිදුවන තැන් සසර ගමනේ යනවා. සසරේ රැඳී සිටිනවා. සසරේ සිටින තැන් විඳින්නේ දුකමයි. ඇයි එහෙම කියන්නේ? ඉපදුණු ඕනෑම සත්වයෙක් තම පැවැත්ම සඳහා කළයුතු රාජකාරි සමුදායක් නියම කරගෙනමයි ඉපදෙන්නේ. ඉපදුණාට පස්සේ පැවැත්ම සඳහා වෙහෙසෙන්නට වෙනවා. පැවැත්ම තුළ රැඳී සිටීම සඳහා නිරන්තරවම කටයුතු කරන්නට වෙනවා.

එසේම අරහත් භාවයට පත් නොවූ සත්වයා පැවැත්ම සාරවත් කරගැනීමට යැයි සිතා විවිධ ඇලීම් නිර්මාණය කරගන්නවා.

රසයි, සැපයි කියා හිතාගෙන ඇලෙනවා. ඇලෙනවා කියන්නේ මොකක්ද? යළි යළිත් ඉපදීම සඳහා කර්ම සකස් කරගන්නවා. මේ කර්ම අතර කුසල කර්මත් තිබෙනවා. අකුසල කර්මත් තිබෙනවා. මේ කවර කර්මයක් වුවත් විපාක දීම සඳහා සසර රැඳී සිටිය යුතු වෙනවා. ඒ කියන්නේ සසර ගමන දිගු කර ගන්නවා. අනේ මොනතරම් මුලාවක්ද? මොනතරම් අපරාධයක්ද?



ලබාගැනීමට ඉතා දුෂ්කර යැයි බුදු වදනින්ම දේශනා කරන ලද මිනිස් භවයක් ලැබූ අප, ඇයි ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනයක් නොගන්නේ? ආයෙත් කවදා නම් මිනිස් භවයක් ලැබේදැයි අනුමාන කරන්න පුළුවන්ද?

මෙන්න බලන්න අප පෙර කළ පින් නිසා ලබාගෙන ඇති සම්පත්.

● නිරය, තිරිසන්, ප්‍රේත, අසුරකාය ආදියෙන් මිදී මිනිස් භවයක් ලැබීම.

● බුදු දහම ඇති රටක බෞද්ධයකු වී මිථ්‍යා දෘෂ්ටික නොවන ජනතාව අතර ඉපදෙමින්, මිථ්‍යා දෘෂ්ටික නොවන ආත්ම භාවයක් ලැබීම.

● විකෘති හෝ මන්දබුද්ධික හෝ නොවීම. යමක් වටහා ගන්නට සමත් බුද්ධියක් තිබීම.

● කියවන්නටත්, අහන්නටත් දහස් ගණනින් දහම් කරුණු තිබෙන, බුද්ධෝත්පාද කාලයක උත්පත්තිය ලැබීම.

ඒත් බලන්න... ඒ සියලු දේ ලැබිලාත්, ඒ ලද මහා පුණ්‍ය ශක්තියේ පල ප්‍රයෝජනයක් නොලබා, සෝවාන් ඵලයට වත් නොපැමිණ, අනේ අප නිකම්ම නිකම් එදිනෙදා කා බී මහේ මැරිලා යන්නට හදන හැටි?

සමහර අය මෙහෙම කියනවා.

"අපි ජීවිතය රස විඳිනවා. ඇයි හැම තිස්සේම අසුබවාදීවම හිතන්නේ? මේ ලැබිච්ච ජීවිතය ගැන සුබවාදීව හිතන්න හෝ. අපි කාලා, බීලා, ඇඳලා, හොඳ රස්සාවක් කරලා, යහපත් දූ දරු පිරිසක් හදලා රටට දීලා, කාටවත් වරදක් නොකර ජීවත් වෙලා, මැරිලා ගියාම ඒකත් පිනක් නේද?"

ඔවුන් ගැන අපට මොකක්ද කියන්න තියෙන්නේ? ඔවුන් මුලා වෙලාද, නැද්ද? ඔවුන් මේ සමාජයේ මානව හිතවාදී පුද්ගලයන් තමයි. ඔවුන්ගේ ජීවිතය තුළදී ඔවුන් යම් යම් පින්, කුසල් කර තිබෙනවා තමයි. ඒත් ඔවුනුත් ඔවුන්ගේ පැවැත්ම සාරවත් කරගැනීමට යයි සිතා විවිධ ඇලීම් නිර්මාණය කරගෙන නේද? කැමිසීම්, ඇඳුම්වලට ඇලිලා, රසවලට ඇලිලා, දරුවන්ට ඇලිලා, රසයි සැපයි කියා හිතාගෙන ඇලිලා. එහෙම නේද? යළි යළිත් ඉපදීම සඳහා කර්ම සකස් කරගෙන, සසරට ඇලිලා, සසර ගමන දිගු කරගෙන නේද?

එහෙම කියපු සමහර අයම ජීවිතයේ විවිධ අවස්ථාවල දී මෙන්න මෙහෙමත් කියනවා.

"අනේ මගේ එකම දරුවා නැති වුණා. මට දැන් ජීවත් වෙලා වැඩක් නැහැ..."

"මං කවදාවත් හිතුවේ නැහැ මට මේ විදිහේ ඉරණමක් උදාවෙයි කියලා. මං මගේ දරුවන්ට උගන්නලා ලොකු මහත් කළේ මොනතරම් දුක් කෂ්ට විඳලද? එයාලා ලොකු ලොකු තනතුරුවලට එනකොට මට හිතුණා මීට වඩා සතුටක් මොකටද කියලා. ඒත් අද එයාලා රට රාජ්‍යවල ගිහිල්ලා. මං මැරෙන මොහොතකවත් එයාලා මෙහාට නැහැනේ. මොකක්ද ඉතින් මං කරපු ජීවිත සටනින් ඇති වැඩේ?"

"දන්නම් කොහොමටවත් ඉවසන්න බැහැ. මීට වඩා හොඳයි මැරෙනවා නම්. මං මොන තරම් සැප සම්පත් මැද රජෙක් වගේ හිටියද? මේ හදිසි ලෙඩේ හැදිලා මං එක තැන් වුණා නේද?"

"මට රස්සාව නැතිවුණේ පෙර කරුමෙකටම වෙන්න ඕනේ. ඇත්තටම ඔය වංචාවට මං සම්බන්ධ නැහැනේ. දෙයියනේ දැන් මේ ගෙවල් හදන්න, වාහන ගන්න, ගත්තු ණයතුරුස් ගෙවා ගන්නේ කොහොමද?"

"අපේ කුරුළු කැදැල්ල කැඩිලා ඉහිරුණේ මගේ බිරිඳ නොසන්තුටු වෙලා ළමයිනුත්, මාත් දාලා ගියාට පස්සෙයි."

අපි යළිත් ඔවුන් ගැන විමසා බලමු. ඔවුන් ඔවුන්ගේ පැවැත්ම සාරවත් කරගැනීමට යයි සිතා නිර්මාණය කරගත් විවිධ ඇලීම් තුළම ගැටීම්ද ඇතිවී ඇති ආකාරය බලන්න. රසයි, සැපයි කියා හිතාගෙන ඇලී ගත් දේම ඔවුන්ට වේදනාවක්, දුකක් ගෙන දී ඇති හැටි බලන්න.

**පරම සත්‍යය නම්, කවර ශ්‍රී විභූතියක් ඇති භවයක ඉපදී සිටියත්, අපට ඕනෑ විදියට, අප අපේක්ෂා කරන විදියට, අප පතනා විදියට, අප ආශා කරනවා විදියට සියල්ල සිදු නොවන බවයි. ඉපදීම දුකයි කියන්නේ ඒක නොවෙයිද? ඒකම තමයි.**

**රාජකීය පණ්ඩිත පූජ්‍ය කොස්ගොඩ විමලවංශ තිස්ස හිමි**

"අනුන්ගේ රළු පරළු බසත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# සැමියාගේ වැරදි බිරිඳගේ වැරදි

# තැන තැන කියවන ඔබට

## එදා විශාඛාවෝ දුන් උපදේශය මතකද?

බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වඩින කල එම නුවර මෙණ්ඩක සිටුහු සත් හැවිරිදි සිය මිණිබිරිය විශාඛාත් බුදුරදුන් වඩිනා පෙරමගට යවති. බුදු හිමි දහම් දෙසති. ඒ විශාඛාවෝ සෝවාන් වෙති.

සැවැත්නුවර මිගාර සිටුහුගේ පුත් පුණ්‍යවර්ධන කුමරුවෝ කේශ කල්‍යාණය, මාංශ කල්‍යාණය, අස්ථි කල්‍යාණය, ඡවි කල්‍යාණය, වයො කල්‍යාණය යන පඤ්ච කල්‍යාණයෙන් යුත් ස්ත්‍රියක ලදොත් පමණක් විවාහ වෙතැයි මව්පියනට පවසති. එපරිදි පංච කල්‍යාණයෙන් යුත් විශාඛා කුමරිය සමග පුණ්‍යවර්ධන කුමරු විවාහ වෙයි. විවාහයට පෙර දින රාත්‍රී ධනංජය සිටුතුමා සිය දියණිය තමන්ගේ ඇතුළු ගබඩාවට කැඳවා පති කුලයට යන කුමරියක විසින් දත යුතු කරුණු දහයක් ගැන කියති.

''පුතණුව, කුලගෙයි වසන්නා වූ ස්ත්‍රී නම් සික්ෂිතව වාසය කළ මැනව. නැදිමයිලො නම් මඳ අවකාශයක් දුටු කලක් අපවම නින්ද කෙරෙති. එසේ හෙයින් ඇතුළෙන් ගිනි පිටතට නොයව. පිටතින් ගිනි ඇතුළට නොගනුව... ඇතුළු ගෙයි දෙවියන් පුදව''

''මෝඩයා මට දරුවෝ ඇත, මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

(පූජාවලිය, 18 පරි.)

මයිලණුවන්ගේ නිවසට ගිය කල්හි මයිලණුවන් වූ මිගාර සිටාණෝ "මුන් සරණ එවනද ද මුන්ගේ පියාණෝ අවවාද පසාරයෙන් දස මාසයක් කීහ. එහි අර්ථ මට නොදනෙයි. එසේ හෙයින් මා මුන් කෙරේ සැක මහන. එහි අර්ථ විචාරනු කැමැත්තෙමි. මුන්ගේ පියාණෝ, පුතණ්ඩ! ගෙයි ගිනි පිටත නොදෙවයි කීහ. ඒ කිමෙක්ද? ඉක්බිති ගෙට ගිනි පසකුත් නොදී මුන් අපගේ පුතණුවන්ට දීග ගෙන බොහෝ දෙනාට වැඩ කරන්නේ කෙසේදයි කළහ. එබසට කෙළඹියෝ "සබාද නැගණියෙනි" යි කීහ. විශාඛාවෝ එබසට කියන්නාහු "අපගේ කුලෙහි ගිනි තබා සියලු රන්රුවන් ආදියත් ඉල්ව ආ කෙනෙකුන්ට නැතැයි යන බසක් කියන කෙනෙක් නැත. දර දඬු කඩකට ලොභයෙන් ගිනි නොදෙවයි කී නිසා නොවෙයි. පුත තොපගේ නැදි මයිලන්ගේ වේවයි පමණක් හෝ වේවයි මඳ වරදක් දුටු නමුත් බැහැර කිසි කෙනෙකුන්වත් නොකියව. ඊට වඩා ගින්නෙක් අනික් නැත. එසේ හෙයින් කේලාම් නොකියවයි කී නිසාය" යි කීහ.

(පූජාවලිය 18 පරි.)

මේ ඉතා වැදගත් අවවාදයකි. විශාඛාවන් ලද දස අවවාදයෙන් පළමු වැන්නයි.

අවංක ආදරයක් ඇති ගෘහ ජීවිතය මනාව ගෙන යාමේ දක්ෂකම් ඇති බිරිඳ කිසි දිනක තම සැමියාගේ පුළු හෝ මහත් වූ කවරම අඩුවක් දෝෂයක් තමන්ගේ ආදරණීය මව සමගවත් නොකියන්නීය. තමා ගැන අඩුවක් බිරිඳගෙන් පිටතට ගියේ නම් ඒ බිරිඳ සැමියාගේ අභිමානයට පලුද්දකි. ඇය ගැන සැමියා කලකිරෙයි. විවාහය යනු එකිනෙකා අවිරුද්ධ ඒකීය සංගමයකි. බිරිඳ කෙරේ සුළුවෙන් ඇරඹෙන භේදය පුළුල්ව බොහෝ විට දික්කසාදයෙන් කෙළවර වන්නේය. අඹුසැමි ප්‍රේමය විනාශ කිරීමට ඇති සාහසික උපක්‍රමයක් ලෙසින් ගෙයි ගිනි පිටතට දීම දක්විය හැකිය. රාජ නාගයකුගේ දළ පහරින් ජීවිතය විනාශ වන්නාක් මෙන් ඉන් සැම විටම ආදරය ප්‍රේමය විනාශව, පවුල් ජීවිතය අවාසනාවන්ත ලෙස කෙළවර වෙයි. සැමියාගේ ආදරය ගරු කරන බිරිඳ නිතරම ඒ රැක ගැනීමට උත්සුක වන්නීය. ඔහුගේ දුර්වලතා ඉඟියකින් හෝ පිටතට නොදෙන්නීය.

"හිමිහට ඇති පද  ම
පිටතට කියන නොතර  ම
පෙන්වන කොනොල් ක  ම
ඉතිරි ගෙයි වසන සැතිරි න  ම

(කාව්‍යශේඛරය, 13 සර්ගය, 15 පදය)

යි ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් දක්වති.

කාගේත් අඩුපාඩු, දෙස්, වැරදි තිබිය හැකිය. ඒ ස්වභාවිකය. මේවා පිටතට ගෙන යන ගෙදරට යහ එන්නන්ට අගවන බිරිඳකගෙන් වනුයේ පවුලටම හානියකි. කවරෙකුවත් ස්වකීය අභිමානයට පලුද්දක් වන කල නොඉවසති.

ගෙයි දෙය පිටත දී
තැන තැන ඇවිද කරන නොපනත්
ලියන්ගෙන් වන වැඩ
ඇතත් උන් කෙරෙහි ලොබ නොකරව්

(ලෝකෝපකාරය)

රණස්ගල්ලේ මාහිමියන් පෙන්වා දෙති.

විවාහ ජීවිතයේදී ගෙදර අඩුපාඩු කියමින් ඇවිදීම අතිශය නිශ්ඵල කටයුත්තකි. අඩුපාඩු වන්නේ කුමක් නිසාදැයි ඔබ පැහැදිලිව දනියි. සැමියා උරණ වන තත්ත්වයට කළ යුතු නොවේ. ජීවිතය සදහට සැපතක් නොවන බවද පැමිණි දුක් පැණිරසයි යන්න සිහි කරමින් සියලු අඩුපාඩු කවනොලු වසා ගනිමින් වීර්යවන්තව නැඟී සිටිමින් සැමියාගේ ගෞරවයටද හානි නොවන සේ කටයුතු කරන විචක්ෂණ බුද්ධිය ගෘහ ජීවිතය මනාව වඩා ගන්නියකි.

"නොසොය නොබල ආවා  නම්
ලද පමණින් වී සැනසු  ම්
ඉඳුව මිසක් ගෙයි අඩ ක  ම්
කීම ලඳුන් නොවේ නර  ම්"

(ඩී. බී. ද ලැනරෝල්)



යන කවිය මට සිහිවෙයි. ගෙදර අඩුපාඩු පිටතට කියන කල ඒ අසන්නාට මහත් අභිරුචියෙන් සැදී පැහැදී සිටින්නෝ වෙති. අසන්නා එක දෙක කියමින් රටපුරා ගෙන යති. මහත් අභිරුචියෙන් හපන්කමක් සේ කියති. මින් වන්නේ ඉමහත් හානියකි. ගෙදර සාමය මුළුමණින්ම බිඳ වැටෙන්නේය. වරද වැටහෙන විට සියල්ල අවසන් වී තමාරය.

"ආයුර් චින්තං ගෘහෙච්ඡිද්‍රම්..." යනාදී ලෙසින් පඬිවරු විසින් පවසන ලද සඟවා ගත යුතු කරුණු නවයේ ගෙදර අඩුපාඩුද එකක් ලෙස දක්වෙයි.

ධනංජය සිටුතුමා පති කුලයෙහිදී නැදිමයිලන්, සැමියා ආදීන්ගේ සුළු වරදක් වුවත් පිටතට නොදෙන්නැයි කීයේ ඊට වඩා මහා ගින්නක් වෙනත් නැති හෙයිනි.

"ඇතුළෙන් ගිනි පිටතට නොයව" බෞද්ධ කාන්තාවන්ට පමණක් නොව සියලු දෙනාට එකසේ වැදගත් වන අවවාදයකි.

**ආචාර්ය සිරිපාල මාදුවගේ**


"යමක් කොට පසුතැවෙන්නට වේද, යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."

# මියගිය අයට පින් ඕනමද?

# නොලැබුණොත් මොකද වෙන්නේ?

# භික්ෂූන්ට දානයක් පිළියෙළ කරන්නට කලියෙන් උන්වහන්සේලා වළඳන්නට කැමති දේ විමසිය යුතුද?

# අධාර්මිකව උපයා ගත් දෙයකින් දන් දුන්නාට ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැද්ද?



දහම් ගැට විමසමු

❒ ස්වාමීන් වහන්ස, මියගිය ඥාතියකු ප්‍රේත ආත්මයක සිට පින් බලාපොරොත්තුවෙන් සිටින බව අප දන්නේ නම් ඔවුන් වෙනුවෙන් පින් දහම් කළ යුත්තේ කොයි ආකාරයටද?

"සානුවාසී" රහතන් වහන්සේ තමන්ගේ මව්පියන් හා සහෝදරයා ප්‍රේත ලෝකයේ ඉපදිලා කියලා දැනගත් විට පින් ලබාදුන් ආකාරය ප්‍රේතවත්ථුවේ පැහැදිලිව සඳහන් වී තිබෙනවා. උන්වහන්සේ පිඬු සිඟා වැඩම කර දානය ගෙනැවිත් රහතන් වහන්සේට පූජා කරනවා මගේ මව්පියන් හා සහෝදරයාට ආහාරපාන ලැබීම පිණිස මේ දානය සංඝරත්නයට පූජා වේවා කියලා. ඒ සැණෙන්ම ඒ මව්පියන්ට, සහෝදරයාට ආහාරපාන පහළ වුණා. ඊළඟට ඒ ප්‍රේතයෝ නැවතත් පෙනී සිට කියනවා අපට ස්වාමිනි ඇඳිවිත්ත බැහැ කියලා. ඊට පසුව මේ රහතන් වහන්සේ සෙරෙප්පු යුගලයක් අරගෙන ගිහිල්ලා එය මහා සංඝ රත්නය උදෙසා පූජා කරනවා මගේ මවුපියන්ට, සහෝදරයාට සැපසේ සිටීමට පින් අනුමෝදන් වේවා කියලා. එවිට ඒ අයට ඇඳිවිත්ත පුළුවන් වුණා. පාංශුකූල වස්ත්‍රයක් සොයාගෙන ගිහින් සංඝරත්නයට පූජා කරලා මවුපියන්ට දිව්‍ය සළු ලැබේවා කියලා පූජා කළා. එවිට දිව සළු පහළ වුණා. එයින් අපට පේනවා රහතන් වහන්සේලා පවා සංඝයා උදෙසා මෙවැනි දානමාන පිරිනමා තිබෙනවා. එසේ පින්කම් කළාම තමයි ඒ පින් ලැබෙලා තිබෙන්නේ.

එක් අවස්ථාවක සඳහන් වෙනවා සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ ආත්ම භාව පහකට පෙර මව පෙනී සිටිමින් කියනවා ස්වාමිනි, මම කලින් ජීවිතයක ඔබවහන්සේගේ මෑණියන්. දැන් මම ප්‍රේත ලෝකයේ දුක් විඳිනවා කියලා. එවිට සාරිපුත්ත මහ රහතන් වහන්සේ සංඝරත්නය උදෙසා දානයක් පූජා කරලා ඒ මවට පින් අනුමෝදන් කළා. ඒ පින් සියල්ල අර මෑණියන්ට අනුමෝදන් වීමට පුළුවන් වුණා.

"දෙව්වූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව් වහා නොමේරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් බිලු දවමින් පසුපස ලුහු බඳී."


### පූජ්‍ය යටමලගල සුමනසාර හිමියෝ පිළිතුරු දෙති

අපේ වර්තමාන සමාජයේ ජීවත් වන අයකුගේ ඥාතියකු මියගිය විට ඒ තැනැත්තාට පින් අනුමෝදන් කිරීමට පැන් වඩනවා. එසේ කිරීමට නීතියක් නැහැ. නමුත් අප සංසරන්නයක් ලෙස එය සිදු කරනවා. අප පැන් වඩනා විටදී කියන්නේ උස් තැන්වල සිට මිටි තැනකට ජලය ගලාගෙන යන්නේ යම් සේද ඒ වගේ මෙතැනින් දෙන්නා වූ පින ප්‍රේතයන් කරා යනවා කියලා තමයි එසේ පැන් වැඩීමෙන් අදහස් කරන්නේ. ඒ වගේමයි අප දානයක් දීලා දෙන පින ප්‍රේතයන් කරා යනවා. හැබැයි අප දෙන පින ගන්න තැනැත්තකු සිටිය යුතුයි.

දිනක් බිම්බිසාර මහරජතුමා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "ස්වාමීනි, අප මියගිය ඥාතීන් උදෙසා දන් පින් පූජා කරලා පින් දෙනවා. ඒ දෙන පින ඒ ඥාතීන්ට අනුමෝදන් නොවුණොත් ඒ පිනට මොකද වෙන්නේ?'' කියලා. එවිට බුදුරජාණන් වහන්සේ වදාළා, "රජතුමනි, ඒ ඥාතියා නැතත් තවත් අය ඉන්න පුළුවන්. මේ දීර්ඝ සංසාරයේ කොපමණ ඥාතීන් අපට හමුවෙනවද? ඒ කවුරු හෝ පින් ගන්නවා'' කියලා. එවිට රජතුමා අහනවා "ස්වාමීනි, ඒ කිසිවකු ඒ පින ගත්තේ නැත්නම් පිනට කුමක් වේද?'' කියලා. එවිට බුදුරජාණන් වහන්සේ වදාළා "රජතුමනි, මේ අපි දෙන පින අනුමෝදන් වෙන්න මේ සංසාරයේ කවුරුන් හෝ ඉන්නවා. එසේ නැත්නම් ඒ පින තමන්ට හෝ අනුමෝදන් වෙනවා. පින නවදාවත් අපතේ යන්නේ නැහැ'' කියලා.

එයින් අපට පේනවා ලෝකයේ සිල්වතුන් පහළ වෙනවා නම්, ගුණවතුන් පහළ වෙනවා නම්, ධාර්මිකව උපයා සපයා ගන්නා ධනය රැස්කරන අය පහළ වෙනවා නම්, ගිහි සිල්වතුන් පහළ වෙනවා නම් පරලොව ගිය අයටත් ඒක සැපයක්. එයට හේතුව තමයි දානාදි පින්කම් කරලා අප පින් දුන්නාම ඒ අය ඒ පින සුවසේ අනුමෝදන් වෙනවා.

❒ සඟ සතු කොට දානයක් පිරිනැමීමේදී භික්ෂූන් සතු කාර්යභාරය කුමක් විය යුතුද?





සාංඝික දානයකදී ඒ දෙන දානය මහත් ඵල මහානිසංස වෙන්න භික්ෂුවටත් යම් ප්‍රමාණයක දායකත්වයක් තිබෙනවා. මූලිකම දේ තමයි සිල්වත්වීම. ඒ තමයි භික්ෂුවකගේ ප්‍රධානම ලක්ෂණය, ගුණය.

එසේ නොමැතිව ගිහි පිරිසට භික්ෂුවක් කවදාවත් අසවල් දේ දානය පිණිස අවශ්‍යයි කියලා කියන්නේ නැහැ. නමුත් ගිහි කෙනකු ඇවිත් ස්වාමිනී, අප දානයක් පිළියෙළ කරනවා, ඔබවහන්සේ වළඳන්න කැමැති කුමක්ද කියා අසනවා. එවිට භික්ෂුව අකැප දෙයක් දානය සඳහා යෝජනා කළහොත් පසුව හෝ ඒ භික්ෂුවට අර දායක තැනැත්තා දොස් තගන්නට ඉඩ තියෙනවා. ඒ නිසා සුදුසුම දේ තමයි තමන් පිළියෙළ කරගෙන ඇවිත් දානය පූජා කිරීම.

❒ දන් දීමට සුදුසු වන්නේ ධාර්මිකව උපයා සපයා ගත් දේ පමණක්ද?

ඇත්තටම ඔව්. දානයකදී කරුණු තුනක් සම්පූර්ණ විය යුතු බව බුද්ධ දේශනාවේ සඳහන් වෙනවා. ඒ තමයි ප්‍රතිග්‍රාහක පක්ෂය (දානය පිළිගන්නා පිරිස සිල්වතුන් වහන්සේ වීම. ඊළඟට දන් දෙන පක්ෂයත්, සීලාදි ගුණධර්මවලින් පිරිපුන් පිරිසක් විය යුතුයි. ඊට පසු දානය. ඒ දානයත් ධාර්මික විය යුතුයි. එවිට උදාහරණයක් ලෙස ගොවියකු කරන වගාවක් ගත හැකිය.

ඔහු ඒ වගාව සඳහා සාරවත් කුඹුරක් තෝරා ගන්නා නම් ඒ සාරවත් කුඹුර වගේ තමයි සිල්වතුන් වහන්සේ. ගොවිතැන ගැන හොඳ අවබෝධයක් තිබෙන ගොවියා වගේ තමයි දන් දෙන පිරිස. සාරවත් බීජ වගේ තමයි ධාර්මිකව රැස් කරපු දෙයින් උපයා ගත් වස්තුව, ධනය. එනකොට ධාර්මිකව රැස්කර ගත් දේ සිල්වතකුට පූජා කරනවා කියන්නේ ගොවිතැන ගැන දන්නා ගොවියකු සරු බීජ, සරු කෙතක, කුඹුරක වැපුරුවා වගෙයි. එවිට නිසි කලට එහි අස්වැන්න ලැබෙනවා. ඒ වගේ උපමාවලින් සඳහන් වන්නේ මේ දානයේ තිබෙන වටිනාකම නිසයි.

**ධර්ම ගවේෂක**

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."



# මෙත් සිත් ඇති, ඉවසන තැනැත්තා
# මහපොළොව මෙන් ශක්තිමත්ය



දේශනාකරණ - මහනුවර අස්ගිරිය මහාවිහාරීය
ගෙඩිගේ රාජමහා විහාරාධිකාරී
ඓතිහාසික පොළොන්නරුව [illegible]
මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහා විහාරීය [illegible] කාරක මහා සංඝ
සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික, ශාස්ත්‍රපති,
පූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි
ශ්‍රී දළදා මාළිගාවේ තේවාභාර නායක ස්වාමීන්ද්‍රයන්
වහන්සේ

"තස්මාතිහ, ඵග්ගුන, තව චෙපි කොචි පාණිනා පහාරං දදෙය්‍ය, ලෙඩ්ඩුනා පහාරං දදෙය්‍ය, දණ්ඩෙන පහාරං දදෙය්‍ය, සත්ථෙන පහාරං දදෙය්‍ය, තත්‍රාපි ත්වං, ඵග්ගුන, යෙ ගෙහසිතා ඡන්දා යෙ ගෙහසිතා විතක්කා තෙ පජහෙය්‍යාසි. තත්‍රාපි තෙ, ඵග්ගුන, එවං සික්ඛිතබ්බං, 'න චෙව මෙ චිත්තං විපරිණතං භවිස්සති, න ච පාපිකං වාචං නිච්ඡාරෙස්සාමි, හිතානුකම්පී ච විහරිස්සාමි මෙත්තචිත්තො, න දොසන්තරො'ති. එවං හි තෙ, ඵග්ගුන, සික්ඛිතබ්බන්ති."

වාසනාවන්ත පින්වතුනි,

අද උතුම් නවම් පුන් පොහෝ දිනයයි. මෛත්‍රිය හෙවත් මිතුරුකම වැදගත් ගුණ ධර්මයකි. එය අප කවුරුත් වචනයට පමණක් සීමා නොකොට ප්‍රගුණ පුහුණු කළ යුතු ගුණාංගයකි. සියලු සත්වයා වෙත මෙත් වඩන පිළිවෙත 'මෙත්ත' සූත්‍රයෙහි මැනවින් විස්තර වෙයි. මෙත් වැඩීමෙන් ලැබෙන ආනිශංස 11 ක් පිළිබඳව 'මෙත්තානිසංස' සූත්‍රයෙහි විස්තරව ඇත. මෛත්‍රී සිතක ඇති අසිරිය පිළිබඳ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද වටිනා දම් දෙසුමක් මජ්ඣිම නිකායෙහි ඇතුළත් කකචූපම සූත්‍රයෙහි සඳහන් වෙයි. අද මේ නවම් පුන් පොහෝ දින මේ පින්වත් පිරිසට මා පහදා දීමට බලාපොරොත්තු එම වටිනා දම් දෙසුමයි.

මේ දම් දෙසුම සඳහා මුල් වී ඇත්තේ මෝලියඵග්ගුන නමැති භික්ෂුවයි. මේ මෝලියඵග්ගුන නම් භික්ෂුව, භික්ෂුණීන් සමඟ නිතරම වේලාව ඉක්මවා කතාබව කරති. එය වරදක් ලෙස භික්ෂූන් පෙන්වා දුන් විට කිපී එම භික්ෂූන්ට දොස් නගති. භික්ෂුණීන්ට කරුණු වටහා දුන්න ද ඔවුහු එය නොපිළිගෙන මෝලියඵග්ගුන භික්ෂුව හරි ලෙස පිළිගනිති. සුළු වරදෙහි වුවද බිය දක්නාසුලු භික්ෂූන් විසින් එය බුදුරදුන්ට දන්වන ලදී. බුදුරජාණන් වහන්සේ එම භික්ෂුව කැඳවා කරුණු විමසා වරද පිළිගත් කල්හි, භික්ෂුණීන් සමඟ වේලාව ඉක්මවා කතාබහ

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැසවිය යුතුය."

කිරීම වරදක් බවත්, එවැනි වරදක් යමෙකු පෙන්වා දුන් කල්හි පිළිගත යුතු බවත් පෙන්වා දෙමින් මෙම ධර්මය දේශනා කළසේක.

එනම්, ගිහිගෙය අතහැර ශ්‍රද්ධාවෙන් පැවිදි වූ කුල පුත්‍රයන් විසින් යම් කෙනෙක් වරදක් පෙන්වා දුන් කල්හි එය පිළිගත යුතුය. සිතෙහි ද්වේෂය ඇති නොකරගත යුතුය. මෛත්‍රිය කළ යුතුය. යමෙක් අප ඉදිරියෙහි තව කෙනෙකුන්ගේ හෝ අපගේ නුගුණ කියන්නේ ද, පරිභව කරන්නේ ද එය ඉවසිය යුතුය. තව කෙනෙකුට හෝ අපට පහර දෙන්නේ ද එය ද ඉවසිය යුතුය. සිතෙහි ද්වේෂය ඇති නොකරගත යුතුය. මෛත්‍රිය කළ යුතුය. ද්වේෂය, කෝපය, තරහව යන මේ කෙලෙස් නැමැති පිළල් සිතින් ඉවත් කර ගත යුතුය. බුදුරජාණන් වහන්සේ එය උපමාවකින් දේශනා කරන්නේ මෙසේය.

යම් ගමක් හෝ නියමක් අසල මහා සල්වනයක් ඇත. එහි සල් ගස් පිළල් වලින් වැසී ඇත. එම සල්වනයට හිතැති එක් පුරුෂයෙක් සල්වනයට ඇතුළුව සල්ගස්වල පිළල් ඉවත් කොට සුද්ධ පවිත්‍ර කොට මනා ලෙස සකස් කරයි. කලක් යන විට එම සල් ගස් හොඳින් වැඩී ශක්තිමත්ව විශාල සල්වනයක් බවට පත්වෙයි. එය කාටත් ප්‍රිය උපදවන එකක් වෙයි. ඔබලා ද සිතෙහි පිළල් වැනි ලාමක අකුසල් බැහැර කොට කුසල් දහම් වඩා, මේ ධර්ම විනයෙහි නැවත නැවත යෙදෙන්න. ශාසනයෙහි දියුණුවට, විපුලත්වයට පත්වන්න.

නැවතත් බුදුරජාණන් වහන්සේ පෙර වූ කතාවක් දේශනා කරන්නේ මෙසේය. එනම්, සැවැත්නුවර වේදේහිකා නම් වූ ප්‍රිය වචන කතාකරන, සංසුන් සිත් ඇති, උඩඟු නොවන ගති ඇති, එමෙන්ම මේ ගුණ නිසා මිනිසුන් අතර ප්‍රසිද්ධ වූ ගෘහපතිනියක් විය. ඇයට කාලී නම් වූ අනලස, කටයුත්තෙහි දක්ෂ දාසියක් විය. ඇයට දිනක් තම ස්වාමි දියණිය සැමැවින්ම ප්‍රිය වචන කතා කරන, සංසුන් සිත් ඇති, උඩඟු නොවන ගති ඇති තැනැත්තියක් ද, එසේ නැතිනම් මා මැනවින් කටයුතු කරන බැවින් ඇගේ සිතේ අවගුණ පහළ නොකරන්නේදැයි පරීක්ෂා කිරීමට සිතක් ඇති විය. එසේ හෙයින් ඇය පසුදින විටක් දවල් වී අවදි වූවාය. එයට කිපුණු වේදේහිකාව ඇයට දොස් නගන්නට වූවාය.

තම ස්වාමි දියණිය තවත් පරීක්ෂා කරනු පිණිස පසු දින ද තවත් දවල් වී නැගිට්ටාය. එයට තදින් කිපුණු වේදේහිකාව ඇයට පරුෂ වචනයෙන් බැණ, තදින් නිග්‍රහ කොට 'පව්වූ දාසිය, වහාම උදේ නැගිටව, කටයුතු කරව' ආදී වශයෙන් කෝපයෙන් පැවසිය. තවදුරටත් තම ස්වාමි දියණිය පරීක්ෂා කරනු පිණිස පසු දින ද තවත් දවල් වී නැගිට්ටාය. එයට අතිශය කිපුණු වේදේහිකාව, දොර පොල්ල ගෙන කාලී දාසියගේ හිසට පහර දුන්නීය. හිස පැළුණු දාසිය ලේ වැගිරෙණ හිසැතිව, ප්‍රිය වචන කතාකරන, සංසුන් සිත් ඇති උඩඟු නොවන ගති ඇති තැනැත්තිය විසින් කළ දේ බලව්, යනුවෙන් කෑ ගසමින් විදි මස්සේ දුවන්නට විය. ඉන්පසු වේදේහිකාව චණ්ඩිය, පරුෂය, නොසන්සුන්ය, කිපෙන තැනැත්තියක, නොඉවසුණු තැනැත්තියක යනුවෙන් ඇගේ අපකීර්තිය, අවගුණ පැතිරෙන්නට විය.

එසේම භික්ෂුව ද කීර්ති ප්‍රශංසා හා සිව්පසය කරණ කොට ගෙන මනා පැවතුම් ඇත්තේ ද, සෞම්‍ය ගතිගුණ ඇත්තේ ද, උපශාන්ත වෙත් ද, ඒවා නොලැබෙන කල්හි කිපෙත් ද, නුගුණ ප්‍රකාශ කරත් ද, එය නියම මහණකම නොවේ. එය කීර්ති ප්‍රශංසා හා ප්‍රත්‍යලාභ අපේක්ෂාවෙන් කරන මහණකමකි. නියම මහණකම නම් ධර්මයටම සත්කාර කරමින්, ධර්මයටම ගරු කරමින්, ධර්මයම පුදමින්, යම් උපශාන්ත බවක්, යම් සුවච බවක් යම් සෞම්‍ය බවක් වේ ද එය නියම මහණකමයි.

මිනිසුන් දෛනිකව කතාබහ කරන වචන පස් ආකාරයකට බෙදිය හැකිය. එනම්,

1. **සුදුසු කල්හි හෝ නුසුදුසු කල්හි කියන වචන**
2. **වූ දෙයක් හෝ නොවූ දෙයක් පිළිබඳ කියන වචන**
3. **මෘදු මොලොක් හෝ රළු වචන**
4. **අර්ථ සම්පන්න වචන හෝ අනර්ථ සම්පන්න වචන**
5. **මෛත්‍රී සහගත වචන හෝ ද්වේශ සහගත වචන**

යමෙක් මෙවැනි දසාකාර වූ වචනවලින් යුත් ප්‍රකාශයක් කරන කල්හි තම සිත් වෙනසකට පත් නොකොට ලාමක වචන ප්‍රකාශ නොකොට, ඒ පුද්ගලයා කෙරෙහි නොකිපී, ද්වේශ නොවී, මෛත්‍රියෙන් හැසිරිය යුතුය.

යම් පුරුෂයෙක් උදැල්ලක් හා කූඩයක් ගෙනැවිත් 'මම මේ මහපොළොව නොපොළොවක් කරමි'යි තැන තැන හාරන්නේය. පස් විසුරුවන්නේය. තැන තැන මළපහ කරන්නේය. මුත්‍රා කරන්නේය. එහෙත් ඔහුට පොළොව විනාශ කරන්නට නොහැක්කේය. ඔහු වෙහෙසට පත් වන්නේය. එසේ හෙයින් යමෙක් ඉහත වචනයක් ප්‍රකාශ කරන කල්හි මහපොළොව මෙන් තම සිත් වෙනසකට පත් නොකොට ලාමක වචන ප්‍රකාශ නොකොට ඒ පුද්ගලයා කෙරෙහි නොකිපී, ද්වේෂ නොවී, මෛත්‍රියෙන් හැසිරිය යුතුය.

එමෙන්ම යම් පුරුෂයෙක් ලා කහ පාට හෝ කහපාට හෝ නිල් පාට හෝ මදටිය පාට හෝ වර්ණ ගෙන 'මම ආකාශයෙහි චිත්‍ර අඳිමි'යි කියා කියන්නේය. එහෙත් එය ඔහුට කළ නොහැක. ඔහු වෙහෙසට පත් වන්නේය. එසේ හෙයින් යමෙක් ඉහත වචනයක් ප්‍රකාශ කරන කල්හි ආකාශය මෙන් තම සිත් වෙනසකට පත් නොකොට ලාමක වචන ප්‍රකාශ නොකොට ඒ පුද්ගලයා කෙරෙහි නොකිපී, ද්වේෂ නොවී, මෛත්‍රියෙන් හැසිරිය යුතුය.

එමෙන්ම යම් පුරුෂයෙක් ඇවිළෙන්නා වූ තණසුලක් ගෙන 'මම මේ තණසුලෙන් ගංගා නම් නදිය උණු කරන්නෙමි'යි කියන්නේය. එය ඔහුට කළ නොහැක. ඔහු වෙහෙසට පත් වන්නේය. එසේ හෙයින් යමෙක් ඉහත වචනයක් ප්‍රකාශ කරන කල්හි සිසිල් ජලකඳක් මෙන් තම සිත් වෙනසකට පත් නොකොට ලාමක වචන ප්‍රකාශ නොකොට ඒ පුද්ගලයා කෙරෙහි නොකිපී, ද්වේෂ නොවී, මෛත්‍රියෙන් හැසිරිය යුතුය.

එමෙන්ම යම් පුරුෂයෙක් මනාව මදින ලද සර සර යන කිසිදු ශබ්දයක් නැති සිදුම් පුලුන් වැනි බළල් සමින් කළ පසුම්බියක් ගෙන 'මම මෙය ශබ්ද ඇත්තක් කරන්නෙමි'යි කියන්නේය. එය ඔහුට කළ නොහැක. ඔහු වෙහෙසට පත්වන්නේය. එසේ හෙයින් යමෙක් ඉහත වචනයක් ප්‍රකාශ කරන කල්හි මදින ලද බළල් ලෝම මෙන් මෘදු මොලොක්ව, තම සිත් වෙනසකට පත් නොකොට ලාමක වචන ප්‍රකාශ නොකොට ඒ පුද්ගලයා කෙරෙහි නොකිපී, ද්වේෂ නොවී, මෛත්‍රියෙන් හැසිරිය යුතුය.

පහත් ක්‍රියා ඇති සොරුන්, දෙපස දඬු ඇති කියතකින් තම ශරීරාවයව කපන කල්හි ඒ සොරුන්ට ද සිත දූෂ්‍ය නොකොට, නොකිපී, මෛත්‍රී කළ යුතුය. තම සිත් වෙනසකට පත් නොකොට ලාමක වචන ප්‍රකාශ නොකොට ඒ පුද්ගලයා කෙරෙහි නොකිපී, ද්වේෂ නොවී, මෛත්‍රියෙන් හැසිරිය යුතුය. යමෙක් සිත දූෂ්‍ය කර ගනීනම් ඔහු මාගේ අවවාදය පිළිපදින්නෙක් නොවෙයි.

එසේ හෙයින් මේ 'කකචූපමෝවාද' ධර්මය නිතර නිතර සිහිකරන්න. එය නිතර නිතර සිහි කිරීම ඔබලාට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, වැඩ පිණිස වන්නේයැයි අවවාද කරමින් බුදුරජාණන් වහන්සේ දම් දෙසුම නිම කළ සේක. මොලියඵග්ගුන භික්ෂුව ඇතුළු සියලු භික්ෂූන් වහන්සේලා එම දම් දෙසුම සතුටින් පිළිගත්හ. පසුව උතුම් අර්හත් භාවය සඳහා අවැසි පිළිවෙතෙහි ගමන් කළහ.

අප මෙත් වැඩිය යුත්තේ හදවතින්මය. එසේ හදවතින්ම මෙත් වඩන විට කුමන බාධක ආවද ඒවා මැඩ පවත්වා ඉදිරියට යා හැක. සිව්පසය මෙන්ම කීර්ති ප්‍රශංසා ආදිය මනාව ලැබෙන කල්හි මෙන් නොලැබෙන කල්හි ද සිතෙහි වෙනසක් නොකොට පවත්වාගෙන යා යුතුය. එසේ නොවන්නේ නම් එබඳු පුද්ගලයා කීර්ති ප්‍රශංසා ආදිය අපේක්ෂාවෙන් පමණක් පිළිවෙත් පුරන්නෙකි. යමෙක් ප්‍රකාශ කරන සුදුසු, නුසුදුසු, සිදුවූ, සිදුනොවූ, මෘදු හෝ රළු වූ, අර්ථවත් හෝ අනර්ථවත් වූ, මෛත්‍රී හෝ ද්වේෂ ආදී ඕනෑම වචනයක් ඉවසීමට දැරීමට තරම් අපේ සිත ශක්තිමත් කරගත යුතුය. මෛත්‍රිය පවතින්නේ එබඳු සිත් තුළය. එබඳු පුද්ගලයාගේ සිත මහපොළොව මෙන් ශක්තිමත් වන අතර, ආකාශය මෙන් විවෘත භාවයට ද, ජලය මෙන් සිසිල් භාවයට ද, මදින ලද බළල් සමක් මෙන් මෘදු භාවයට ද පත්වෙයි. මෙත් සිතක ඇති උපරිමය කියා පෑමට දේශිත 'කකචූපමෝවාදය' දැරීමට සමත් වන්නේ එබඳු සිත් ඇති පුද්ගලයාය. ඔබත් මෙත් සිතක අසිරිය විඳගැනීමට මේ දම් දෙසුම පිළිපදින්න. ඔබ සැමට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ පිහිට ලැබේවා.

[illegible]



# යශෝධරාවගේ යශෝරාවය

සංසාරයෙන් සංසාරයට පුරාගෙන පැමිණි ප්‍රේම පාරමිතාවක් වෙනුවෙන් නිදසුන් දක්වන්නේ නම් සිදුහත් යශෝධරා තරම් පරමාදර්ශ කොට දැක්විය හැකි නිදසුනක් තවත් හමුනොවන තරම්ය.

සසරින් සසරට නොසිඳෙන ජල දහරාවක් සේ ගලා ගලා ආ ඒ ප්‍රේමය ගැබුරේ සිත්තම්ව ඇත්තේ සොඳුරු ඡායාවන්ය. අකලංක, පිවිතුරු, ස්වර්ණමත්, උත්තරීතර ප්‍රේමයක මතක සටහන්ය.

නිල් කැටේට දිලිසෙන පිවිතුරු දියවරක් සේ යශෝධරාවගේ හද මඬල සිදුහත් වෙනුවෙන් පිළිසිඳ ගත් ප්‍රේමයෙන් පූර්ණ වූයේ සංසාර ගමනේ දුර ඈත භවයකදීය. එතැන් පටන් සිදුහත් කුමරු බුද්ධත්වය සාක්ෂාත් කරනා සංසාර ගමනේ අවසන් භවය තෙක්ම යශෝධරාවෝ ඒ ප්‍රේමය තම ජීවිතයම සේ සලකමින් සුරැකි කොට ගත්හ.

යශෝධරාවන් එන කවි සිතට බොහෝ සෙයින් හැඟීම්බර වන්නේ යශෝධරාවන්ගේ ප්‍රේමයේ තරම ඒ කවි පද පේළි ඔස්සේ වැක්කෙරෙන හෙයිනි.

"පෙරමින් කඳුළු කිරි දරුවකු අතින් ද රා
පෙරළා නොගොස් පෙම්බර මව්පියන් ක රා
දරදඬු ගැසුණු අතපය හාමිනේ දී රා
නරකාදියක් අද හිමියනි යශෝධ රා

කාරුණාව බුදු වෙනවා ලකුණු දනේ
නැර කැටුව ආවා මම ස්වාමි නේ
භාවනාව තොර නොකරමි සිතින් අනේ
මාලිගාව අද පාළුයි සුවාමි නේ

ඉකිබිඳ අඬන වැළපෙන පති දනට රක
දෙනවද අනේ අගනන් හට මෙහෙම දුක
නැණ මහ පතාවතිය ගේ පෙර සිරිත දැක
කෙරුවද අනේ හිමියනි අද එකට එක

සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳට
නිබඳ බොජුන් රස කර දුන් වළඳනට

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් මිදුන් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

සුවඳ පලාපල මැවියන්
සුවඳ මල් නිතර පිපියන් රන්

හිමියන්ට
සඳට

සිදුහත් කුමරු ගිහිගෙය ගැන දනුණු අප්‍රමාණ වූ කලකිරීමෙන් ගිහිගෙය අභිනික්මන් කළේ තම ලෙයින් සුජාතක පුත් කුමරු මෙලොවට සපැමිණි දිනයේදීමය. කිරිකැටියකු සමග රජ මැදුරේ තනි වූ යශෝධරාවට රජ මැදුරේ මොන තරම් සැප සම්පත්තීන් තිබුණත්, පරිවාර ජනයා සිටියත් තම හිමි සඳගේ අභිනික්මන දරාගත, වාවාගත නොහැකි විය.

තම හිමි සඳ මේ ගමන ගියේ දුකින් ආතුර මුළු මහත් ලෝකයේම ආතුර සිත් විමුක්තියේ ආලෝකයෙන් සුවපත් කරන්නට වග නුවණැති යශෝධරාවෝ තේරුම් ගත්හ. එහෙත් සමුදිය යුතු වූයේ සංසාරයෙන් සංසාරයට රැකගෙන ආ ප්‍රේමයකටය. සංසාරයෙන් සංසාරයට තම ජීවිතය සුවපත් කළ ප්‍රේමයකටය.

සඳ වතුරක් සේ අසිරිමත්ව ජීවිතය මත සඳ දිය වැස්සක් සේ ඇද හැලුණු ප්‍රේමයටය. එසඳ ඒ සඳ ප්‍රිය වියෝගය දරාගත නොහැකි සංවේගයෙන් ආතුරව හඬා වැටුණාය. එහෙත් ඒ ඇසිල්ලේදී වුව යශෝධරාවෝ කඳුළු දරාගෙන ප්‍රාර්ථනා කළේ තම හිමි සඳට සුවය හා සැනසුමය.

ඒ සංසාරගත ප්‍රේමයයි. බුද්ධත්වය සාක්ෂාත් කළ බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුර පිරී පුරා සඳක් සේ වඩිමින් ශාක්‍යයන්ගේ මානය දුරු කරන්නට යමා මහ පෙළහර පෑ ඉනික්බිති ශාක්‍යයෝ බුදුරජාණන් වහන්සේගේ දෙපා මුල වැඳ වැටුණාහ. පෙරදක තම හිමි සඳ අද බුදු බව සාක්ෂාත් කළ මහා බුදුවරයෙකි. මුළු ලෝකයේම හිලන් සිත් සුවපත් කරන වෙදදුරෙකි. වේදනාවෙන් සංසාර දුකින් පීඩිත සිත් සැනසිලිදායක විමුක්තිය සුවයෙන් සුවපත් කරන විමුක්තිදායකයෙකි. ඓශ්වර්ය පසෙක ලා ලෝ වැසියන්ගේ හිත සුව පිණිස මහ රජ මැදුරක රජ සැප අත්හල කුමරු අද නිර්වාණය නම් සුවයෙහි සැනසෙන ආසා බන්ධන සියල්ල අත්හල සම්බුද්ධත්වයේ මහ රජෙකි. සම්බුද්ධත්වයට පත් සම්බුද්ධ මහ රජෙකි.

පෙරද සසරින් සසරට හිමිවූ ප්‍රේමයෙහි අයිතිය තව දුරටත් අද තමාට හිමි නැත. පෙරද තම හිමි සඳ... අද සම්මා සම්බුද්ධත්වයට පත් බුදුවරයෙකි. අසිරිමත් සඳක් සේ ඒ බුදුරජාණෝ බුදු වදනින් දේශයම ඒකාලෝක කරන සේක.


රජ මැදුරේ හිඳ යශෝධරාවෝ බලා සිටියහ. කිඹුල්වත් පුරයට සපැමිණි බුදුරජාණන් වහන්සේ දකින්නට කිඹුල්වත් නුවර වැසි සියල්ලෝම යති. එහෙත් කප් සුවහස් කල් රැකගත් ප්‍රේමය පසුතුර දරා ගත් යශෝධරාවෝ නිහඬය. ප්‍රේමය නොවෙනස්ය. අල්පමාත්‍රයකිනිදු වෙනසක් නැත. එනමුදු යශෝධරාවෝ නිහඬය.

භවයෙන් භවයේ තම සෙවණැල්ල සේ තමා අත්නොහැර පැමිණි ප්‍රියාවිය ඇයය. තමන් වහන්සේගේ බෝධිසත්ව භවයකදී තමන් වහන්සේ වෙස්සන්තර රජුව ඉපදී පාරමිතාවන් පූරණය කරනු වස් දරුවන් දන් දුන් පසු තමා කෙරෙහි වූ ප්‍රේමය වෙනුවෙන් තම පාරමිතාව වෙනුවෙන් මවකට දරාගත, වාවාගත නොහැකි දරු වියෝව දරාගත්, වාවාගත් මද්‍රි දේවිය ඇයයි. දස මසක් කුස දරා ලෙය කිරට හරවා පොවා හැදූ දරුවන් දන පාරමිතාව පුරන්නට දන් දුන් ඒ සඳ හඬා වැළපෙමින් වුව ඒ දුක දරා ගත් ප්‍රියම්බිකාව ඇයයි.

තමන් වහන්සේ සඳ කිඳුරෙක්ව උපන් භවයේදී සඳ කිඳුරියව ඉපදී ප්‍රේමය නම් මෙයැයි පෙන්වූ උත්තුංග ප්‍රේමයේ ප්‍රතිබිම්බය ඇයයි.

ඒ දිගු සසර ගමනේ අවසන් අත්භවයේදී සෙවණැල්ල සේ තම ජීවිතය හා බැඳී සිටි ප්‍රියාවිය ඇයයි. එද සඳ කිඳුරිය අද යශෝධරාවය. සසරින් සසරට රැගෙන ආ නොකලැල් ප්‍රේමයත්, පතිදහමත් ළය මඩල පුරැකී කොට ගෙන යශෝධරා බලා හිඳින්නීය.

ඇ සොඳුරු පතිනියකි. ඒ සොඳුරු පතිනිය සතු උත්තම ගුණාංග මෙපමණකැයි, මෙපමණකැයි කියන්නට බැරි තරම්ය.



බුදුරජාණන් වහන්සේ යශෝධරාගේ රජ මැදුර වෙත පැමිණි සේක. සඳක් සේ වැඩී බුදු හිමි පාමුල යශෝධරා දේවිය වැඳ වැටුණාය. උන්වහන්සේගේ සිරිපතුල් මත ඇ කඳුළු දවටුණි. මහ මෙරක් තරම් සිත පිරූ දුක කඳුළු ලෙසින් දෝර ගලා ගියේ සම්බුදු බුදු හිමියන්ගේ සිරිපතුල් මතය.


තමා වෙනුවෙන් රස බොජුන් අත්හළ යශෝධරා ඇයයි. තමා වෙනුවෙන් ආභරණ සළු පිළි හැරද කසාවත් දරූ යශෝධරා ඇයයි. ඔබ හැර මට වෙන ඉසුරක් නැතැයි යන සිතින් සියලු ප්‍රාර්ථනා, බලාපොරොත්තු තම ප්‍රේමය මතම දරූ යශෝධරා ඇයයි.

අප්‍රමාණ පති භක්තියෙන් තමා වෙනුවෙන්ම ජීවිතය කැප කළ යශෝධරා ඇයයි. එහෙයින් යශෝධරාවට ඊසී සේ වැළපෙන්නට ඉඩ දී බුදුරජාණන් වහන්සේ නිහඬ වූ සේක. ඉනික්බිති දහම් අමා සුවයෙන් ඇ සිත සුවපත් කළ සේක.

පති පතිනි ප්‍රේමය සංසාරයෙන් සංසාරයට එන බන්ධනයකැයි කකුල මාතා හා නකුල පිතා බැඳීමද කරුණු පහදයි.

පූජ්‍ය කිරින්දේ අස්සජි හිමි

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



# ගිලනුන්ට උපස්ථාන කරන්නෙකු සතුවිය යුතු ගුණාංග

සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ නිර්මල බුදු දහම ලොව පුරා පැතිරෙමින් පවතියි. එසේ වුවත් ලෝකයම ද්වේශ ගින්නෙන් දැවෙමින් පවතියි. රාග ගිනින් සත්වයෝ අසහනයට පත්ව සිටිති. මෝහාන්ධකාරයෙන් වෙළුණු සත්වයෝ මග නොමග නොදන මංමුලාව සිටිති. උනුන් හා වාද විවාද කරති. කපා කොටා ගනිති. මරති, මැරෙති. කෝටි 700 ක් පමණ වූ ලෝක ජනගහනයෙන් 40,000 කට අධික පිරිසක් දිනකට මියයති. බුදුදහම ලොව සුවපත් කරන ප්‍රමුඛ දහම බවට පත්ව ඇත්තේ මෙබඳු පරිසරයක් තුළය.

කරුණාව, දයාව, මෛත්‍රිය, මනුෂ්‍යත්වය ශීඝ්‍රයෙන් පිරිහෙමින් පවතියි. පරාර්ථය වෙනුවට ආත්මාර්ථය ප්‍රමුඛස්ථානයට පත්ව ඇත. දුකට පත්වූවෝ ලොව සීසීකඩ විසිර සිටිති. ඔවුන්ගේ දුක, සන්තාපය, වේදනාවන් දුරලන්නෝ අතියයින් දුර්ලභ පරමාදර්ශී මනුෂ්‍යයෝය. උදර හදවත් සිතැත්තෝය.

මානව සංහතිය නමැති වෘක්ෂයේ එදමෙද තුර විකසිත වූ සුපුෂ්පිත සුගන්ධවත් පුෂ්පය මහා කාරුණික හදැති සිතැති බුදුරජාණෝය. "ආසියාවේ ආලෝකය" නමැති කෘතියේදී ඒ බව කීවේ ශ්‍රීමත් එඩ්වින් ආනෝල්ඩ්ය. ලෙඩට දුකට, වේදනාවට

පත්වූවන් සොයා, විමසා ඔවුන්ට පිහිට වූ උත්තරීතර මනුෂ්‍යරත්නය සම්බුදුරජාණෝමය.

උපන් සෑම සත්වයාම ලෙඩට, ජරාවට, වයසට පත්වේ. එය අනුල්ලංඝනීය පරම සත්‍යයක්ද වේ. චතුරාර්ය සත්‍ය ධර්ම විවරණයේදී "නන්ථතතාමං දුක්ඛං අරිය සච්චං" යනාදී තැන්වල එය ප්‍රකාශිතය. ලෙඩට, ජරාවට, වයසට නොයන සත්වයෙක් නැත. එය දුකක්ද වේ. මේ නම් භව දුකයි. මේ භව දුකට බෙහෙත් දන්න බැවින් බුදුහිමි සත්හට වන බව දුකට වෙදණන්" යනුවෙන්ද හැඳින්වූහ. ඒ බුදු සිරිත අසිරිමත්ය. උන්වහන්සේ "යථාවාදී තථාකාරී - යථාකාරී තතාවාදී" ගුණයෙන් යුක්තය. දෙසූ දේ අනුගමනය කොට පිළිපැද පෙන්නූහ. ඒවායේ ගුණද කීහ. මේ අතර ගිලානෝපස්ථානයද උන්වහන්සේගේ ශ්‍රී හස්තයෙන්ම සිදුකොට ආදර්ශ සපයා අනුසස් දෙසූහ. පූතිගත්ත තිස්ස තෙරුන්ගේ කතා වස්තුවෙන් ඒ බව වඩාත් හොඳින් පැහැදිලි වේ. වරෙක උන්වහන්සේ "යෝ ගිලානං උපට්ඨෙය්‍ය සෝ මං උපට්ඨෙති" යනුවෙන් දේශනා කළ සේක. එහි අදහස යමෙක් ලෙඩුන්ට උපස්ථාන කරයිද හෙතෙමේ තමන් වහන්සේට උවටැන් කළා හා සමාන බවයි. මෛත්‍රිය, දයාව, කරුණාව, ඉවසීම හා පරිත්‍යාගය ආදී උතුම් ගුණාංග පෙරදැරි කරගනිමින් ගිලනුන් නෑවීම, පහසුකම් සැපයීම, කැමිකිම් දීම, බෙහෙත් ගැල්වීම, පෙවීම ආදියත් ගිලනුන්ගේ වාසස්ථානාදිය හා වස්ත්‍රාදියත් පිරිසිදු කරදීම සරලව ගිලානෝපස්ථානය ලෙස සැලකීමට පුළුවන. ලෙඩා, ගිලන් පුද්ගලයා කුමන සමාජ ආර්ථික මට්ටමක සිටියද ඔහු කෙරේ සම මෙත්සිත් පැතිරවීම ගිලානෝපස්ථානයෙහි නියැළෙන්නහුගේ යුතුකමකි. අංගුත්තර නිකායේ, ගිලාන වර්ගයේ ගිලානුපට්ඨාන සූත්‍රයේ ලෙඩුන්ට උවටැන් කරන්නෙකු සතුවිය යුතු ගුණාංග පහක් බුදු හිමි පෙන්වා දුන්හ. ඒවා සරල පරිවර්තනයක් වශයෙන් පහතින් දක්වමු.

1. **ඖෂධ, බෙහෙත් වර්ග සම්පාදනය කිරීමට සමතෙක් වීම.**
2. **ලෙඩාට කැප අකැප දේවල් දන කැප දේ සපයා දී අකැප දේ බැහැර කිරීමට සමතෙක් වීම.**
3. **ලාභ, කීර්ති, ප්‍රශංසා අපේක්ෂා නොකර මෙත් සිත් ඇතිවම ගිලානෝපස්ථානයේ යෙදෙන්නෙකු වීම.**
4. **ලෙඩාගේ මලමූත්‍ර, සෙම්, සොටු, කෙළ, වමනය ආදිය කෙරෙහි අප්‍රසන්නව කටයුතු නොකරන්නෙකු වීම.**
5. **සුදුසු අවස්ථාවලදී ලෙඩාට ධාර්මික කතා කියා දී පහදවන්නට, සතුටු කරන්නට හා සමාදන් කරන්නට සමතෙකු වීම.**

ගිලානෝපස්ථානයේ නියැළෙන්නකු සතුවිය යුතු ගුණාංග බව දේශනා කළහ. ලෙඩවීම දුකකි. ආතුරයන්ගේ දුක දන හදවත් කම්පාවට පත්කර ගන්නෝ සත්පුරුෂයෝය. "පර දුක්ඛේ සති සාධූනං හදයේ කම්පනං කරෝති ති කරුණා" කීවේද එයමය. මේ කාරණා අනුව ගිලානෝපස්ථානය සත්පුරුෂයන්ට අයත් උදර කටයුත්තක් බව හඳුනා ගැනීමට පුළුවන. යට කී කරුණු පහෙන් පරිපූර්ණ නැති පුද්ගලයා ලෙඩුන්ට උපස්ථාන කිරීමට සුදුසු නැති බවද ඒ සූත්‍රයේම දේශනා කර තිබේ.

ලෙඩුන් නැති නිවසක් නැත. ලෙඩ නොවූ සත්වයෙක්ද නැත. පෙරත් නොසිටියහ. අදත් නැත. මතුත් එසේමය. අද නැතත් හෙට හෝ ගිලන් වනු ඇත. උතුම් නිවන් අවබෝධය කරන තුරු ලෙඩට මුහුණ දීමට සිදුවනු ඇත. සත්පුරුෂයෝ වනාහි ලෙඩුන් (කායික-මානසික ගිලනුන්) දුකට පත්වූවන්, දේවදූතයන් සේ සලකති. හෙතෙමේ නුවණින් විමසා බලන්නේ ගිලනුන්, ලෙඩුන් කෙරේ සකල වූ කරුණා සිත් ඇතිව මෙත් සිතින් උවටැන් කරනුයේ තාමුන් මරණින් මතුයෙහි ස්වර්ග මෝක්ෂ සැපය සිද්ධ කරගන්නේය. මිනිසුන්ට පමණක් නොව ලෙඩින් පීඩිතව දුකින් පෙළෙමින් සිටින සතුන් කෙරෙහිද අනුකම්පාවෙන් පෙර සිංහල දීපයේ රජදරුවෝ උපස්ථාන කළහ. අනුරාධපුර රාජ්‍යවධියෙහි රජුන් කෙරෙහි ගිලන් උවටැන් පිළිබඳ බුද්ධ භාෂිතය කෙතරම් තදින් බලපෑවේද යන්නත් රජදරුවන් කොතරම් පුළුල්ව එම සේවාව සිද්ධ කළාද යන්නත් බුද්ධදාස රජු කළ නාගෝපස්ථානයෙන් තහවුරු වේ.

උක්ත කරුණු සැලකිල්ලට ගනිමින් සත්පුරුෂ පින්වත් සාධුන් හැකි සෑම අවස්ථාවකම ගිලානෝපස්ථානයත් ඒ හා බැඳුනු සෙසු කටයුතුවලටත් දයකත්වයක් ලබාදීමට කටයුතු කිරීම උභයාර්ථ සාධනයට හේතුවනු ඇත. ලෙඩට පත්වූවකුට උපස්ථාන කිරීම ජාති, ආගම්, කුලමල, දුප්පත්, පොහොසත්, උගත්-නූගත් භේද අනවශ්‍යය. අත්‍යවශ්‍ය වනුයේ කරුණාවයි, දයාවයි, මෛත්‍රියයි. යට කී ගිලානුපට්ඨාන සූත්‍රයේ ඒ බව දේශිතය. පූතිගත්ත තිස්ස තෙරුන්ගේ කුණුව සැරව ගලමින් තිබුණු ශරීරය තම දෑතින්ම උලා, නාවා පිරිසිදු කළේ භව දුකට බෙහෙත් දත් මහ වෙදදුරු බුදුරජාණෝමය. එබඳු පරමාදර්ශී ආගමික නායකයෝ ලොව අතිශය දුර්ලභයහ. නොමැරෙන, වයසට නොයන, ලෙඩට දුකට පත්නොවන, සදාකාලික ජීවිත අපට නැති බවත් ඉතා කෙටි කලකින් මෙලොවින් සමුගත යුතු බවත් නිතර සිහි කිරීම අගනේය.

(වැඩිදුර දනගැනීමට අංගුත්තර නිකාය, 3 කොටස, පංචක නිපාතය, බු.ජ.ත්‍රි.ග. 234 පිටුව, ගිලානුපට්ඨාන සූත්‍රය)

**මල්වතු මහා විහාරවාසී**
**ශාස්ත්‍රපති මැදමහනුවර ධම්මසිරි හිමි**
**(බී.ඒ., එම්.ඒ. පුරාවිද්‍යා)**



# පව් සෝදගන්නේ කොහොමද?

පුණ්ණාදසී අනේපිඬු සිටු මැඳුරේ පරම්පරාවෙන් පැවත එන දාස දෙමව්පියනට දාව මෙලොව එළිය දුටු දැරියක වූවාය. කාලයාගේ ඇවෑමෙන් ඈ උස්මහත් වනවිට කඩවසම් බවක් පළ කළාය. පුණ්ණා උපතින් දාසියක වූවත් ඇගේ දේහ ලක්ෂණ තුළින් නම් ඒ බව පළ නොවිය. ඇගේ මුහුණෙහි පිළිබිඹු වූ තෙදවත් බව සිටු දේවිය තුළවත් පිහිටා නොතිබිණි.

පුණ්ණා දාසිය නිතරම සිටු මැඳුර පිළිවෙළකට තියාගන්නට මහන්සි වූ අතර තමාද පිරිසිදුව සිටීමෙන් ඇඳුම් පැළඳුම් කුමවත්ව ඇන්දාය. මෙය සිටු යුවළගේ ප්‍රසාදයට හේතුවූ අතර සමහර ගැටලුකාරී අවස්ථාවලදී මෝඩ ගැහැණු කෙල්ලගේ උපදෙස් අනුව ක්‍රියා කරන්නට තරම් ඔවුහු නිහතමානී විය.

මේ සිටුමැඳුර සමීපයෙන් ගංගාවක් ගලා බසී. වැසි සමය පැමිණ ඇති නිසා ගඟ පිරී උතුරා යන තරමට දියෙන් පිරී ඇත. කාලගුණය සීත ගුණයෙන් යුක්තය. එහෙත් ගඟේ දිනකට කීප වරක්ම ස්නානය කරන එක්තරා බමුණෙකු නෙත ගැටෙන්නීය. තරුණියට දිය නාන බමුණා සමග කතා කිරීමට වුවමනාව ඇතත් යම් විදියකින් ස්ත්‍රියක් කතා කළ පමණින් හෝ ඈ වැනි දාස කෙල්ලක් කතා කිරීමෙන් බමුණාට නිගරුවක්, ඔද්දල්කමක් වේය යන හැඟීමෙන් ඇගේ සිත තවතා ලැබුවාය. ලෝකය පිළිබඳ යම්කිසි වැටහීමක් ක්‍රමයෙන් ලබමින් සිටි ඇට වහල් බවෙන් දිවි ගෙවුවත් දීන නොවූ සිතක් වූවාය.

"මට සමාවෙන්න. මේ ගඟට දිය ගෙන යන්නට එන හැමවිටකම වාගේ ඔබතුමා දවසකට කීපවරක් ස්නානය කරනවා දකිනවා. මා දිය ගෙනයන්නේ රාජකාරියේ කොටසක හැටියටයි. ඒත් ඔබතුමා නාන්නේ, කවුරු හරි ඔබතුමාට පවරා තිබෙන යම්කිසි රාජකාරියක් ඉටුකිරීම පිණිසද?"

"මෝඩ කෙල්ල, තී කටට ආ පලියට උතුම් වූ අපට අපහාස කරනවද? තී දාසියක් වග නොදන්නීද? මා උතුම් පරම්පරාවකට අයත් බ්‍රාහ්මණයෙක්. මා දවසට හත් අට වර දිය නාන්නේ කාගෙවත් රාජකාරියක් ඉටු කරන්නට නොවෙයි. අපට රාජකාරි නියම කරන්න ඉන්නේ දෙවියෝ විතරයි. අප පැවත එන්නේ දෙවියන්ගෙන් බවත් තී නොදන්නීද? මා අතින් වෙන පව් සෝදා හරින්නටයි මා දියේ ගිලි ගිලී ස්නානය කරන්නේ."

"ම්... පින්වත් බමුණුතුමනි, ඔබ හරිම නුවණැති වැඩකුයි කරන්නේ. මේ සීතල කාලේ ඇඟි ගැහී දවසට හත් අට වරක් නාන්නේ. අපූරු පව් සේදීම" පුණ්ණා උපහාසයෙන් මෙන් කීවාය.

"ඉතින් බ්‍රාහ්මණතුමනි, නෑ පමණින් පව් සේදී යනවා යැයි විශ්වාසද?"

"ඇයි තිට විශ්වාසයක් නැද්ද?"

"හොඳයි බ්‍රාහ්මණතුමනි, මේ ගඟේ සිටින මාළු, ඉබ්බො, දියබරි, දියනයි, කබරයො, කිඹුල්ලු ජලයෙහිම වාසය කරන නිසා උන් ඔබතුමාට වඩා පින්වන්තයින්. ඔවුන්ගේ පව් කොහොමවත්ම ඉතුරු වෙන්නේ නැහැ. හැම වෙලේම පව් සේදීමට පව් කළ යුතුයි. ඔබ ඔය විදියට දියේ ගිලෙන විට සෝදා නොයාද? අනෙක මේ ගඟේ මිනීමරු කිඹුලන් ඔබතුමා ගිල දැම්මොත් පව් සේදීම කෙසේ වෙතත් ඔබගේ ප්‍රාණය සහිත කඳවත් ඉතුරු වේද?"

"ම්... ඇයි ඔබතුමා නිහඬ?"

"නෑ දැරිය, තී කියූ දෑ මා තේරුම් ගත්තා. එහි ඇත්තක් ඇති බව සිහියට නැගෙනවා."

"එපා බ්‍රාහ්මණතුමනි, මා කියූ පමණින් හෝ වෙනත් පඬිවරයෙක් කී පමණින් හෝ එකවර පිළිගන්න එපා. ඔබම මේ ගැන තවත් ඥානය විහිදුවා සිතා බලන්න. කවරදාකවත් ඔබට මෙයින් යහපතක් වේද? ඇත්තේ දුක් විඳ මරණය වැළඳ ගැනීමේ ලාභය පමණයි."

"ඔව් දැරිය, මගේ මෝඩකම වැටහෙයි. මට යා හැකි යහමග පෙන්වා දිය හැකිනම් පින් සිදුවෙයි."


"පින්වත් බ්‍රාහ්මණය, මට එය කළ නොහැකියි. එනමුත් ඔබගේ අඳුරෙන් වැසී ගිය මෝහය දුරු කරගෙන සත්‍යය ලබාගැනීමට මුණගැසිය හැකි උතුමෙක් වැඩ සිටින ඉසව්ව පමණක් නිවැරැදිව කිව හැකියි."

ඇය යා යුතු මඟ කියා දී වතුර භාජනයද උකුල මත රඳවාගෙන කඩිසර ගමනින් සිටු මැඳුර කරා පිය නැඟුවාය.

ධාරාණිපාත වැස්ස ගඟ ඉහිරී යන්නට සූදානම්ය. සුළඟ, ගහ කොළ අමරවමින් විටෙක තදින් හමා යයි. එහෙත් පරිසරය සිසිල් ගුණයෙන් යුක්තය. මෙවැනි වැසි දිනයක බුදුන් වහන්සේ ඇතුළු පන්සියයක් මහා සංඝයාට අනේපිඬු සිටාණෝ සිය දේවිය, පුණ්ණා ඇතුළු සේවක පිරිස වැසි නොතකා පහන් සිතින් දානය රැගෙන යන්නෝය. මාවත තැනින් තැන කැඩී ගොස්ය. ගස් අතු පාර හරහා වැටී ඇත.

අනතුරුව දක්නට ලැබුණේ බුදුරජුන් ඇතුළු සංඝයා දහවල එළඹෙන තුරු පිළිසඳර කතාවට වැටී සිටින අයුරුය. කොසොල්, බිම්බිසාර වැනි බලගතු රජවරුද, අනේපිඬු, ඝෝෂක වැනි සිටුවරුද, විශාඛා, සුමනා වැනි මහා උපාසිකාවන්ද මෙදින විහාර භූමියේ දක්නා ලදී.

මේ කා අතරත් ඇතිවූයේ පිණ්ඩපාත සමය නිසා විටින් විට



අද හැලෙන වැස්ස හේතුවෙන් බුදුරජුන් ඇතුළු සඟ පිරිසට තෙමෙන්නට ඇති ඉඩ ප්‍රස්ථාව වැඩි බවය. උසස් පෙළේ උපාසක උපාසිකාවෝ සාකච්ඡා කර තීරණයකට එළඹිණි. බුදුරදුන් ඇතුළු මහා සංඝයාට පිණ්ඩපාතය සඳහා නොවඩිනා ලෙසටත්, දහවල් දානය එම ගෙවලින් සපයන වගත් බුදුහිමියන්ට දන්වූහ. බුදුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. තමන් වහන්සේ පිණ්ඩපාතය කරන කාලයේ එසේ වැඩිය යුතු බවත්, විහාරයේ වැඩ සිට දානය ලබාගැනීමෙන් කිසිවකුට යහපතක් නොවන බවත් වදාළ සේක.

මහ රජවරු, සිටුවරු, උපාසකවරු බුදුරජුන්ගේ මේ ප්‍රකාශයෙන් කම්පා වී පසුබා සිටියෝය. බුදුරජුන් ඇතුළු මහා සංඝයා නියමිත වේලාවට පිඬු පිණිස විහාර ගෙයින් බැස වඩින විට පුණ්ණා දසිය සොවින් දෙනෙතට කඳුළු පුරවා ගත්තාය. බුදුන් මහා සඟ ගණ සමඟ තෙමී තෙමී වඩින සේක. ඇ රජවරු ඉදිරියේ පසුබා සිටියත් තම අදීන සිත රජ බලයට වඩා ඉදිරියෙන් ක්‍රියාත්මක විය.

කොසොල් මහරජ ඉදිරියට පැමිණි පුණ්ණා බැගෑපත්ව "මහරජතුමනි, ඔට පුළුවනි බුදුහාමුදුරුවෝ නතර කරන්න."

මේ වචනයෙන් ඔවුහොවුන් මුහුණ බලන්නට වූහ.

කොසොල් රජතුමා පිළිතුරු දෙන්නට කලින් අනේපිඬු සිටුතුමා ඔහුට නොදනෙන පරිදි ඉඟියක් පා ඇ තමා සමීපයට කැඳවූයේය.

"මේ දසිය, තිට එය කළ හැකි නම් තිගේ පරම්පරාවම මෙතැන් සිට දස බවෙන් මිදුවන බවට මම සහතික වෙනවා" යි අනේපිඬු සිටුතුමා කීය.

ඇ වැස්සේ තෙමී තෙමී මහ සඟන පසුකරමින් බුදුරදුන් ඉදිරියට දිව ගියාය. බුදු පාමුල මුණින් වැටී ඇඟිලි බැඳි දෑතින් මඩ නොතකා වැඳ වැටී බුදුන් වහන්සේට පිඬු සඳහා නොවඩින ලෙස අයැද සිටියාය.

"නැගණියනි, මගේ ගමන වැළකුවහොත් නුඹට යහපතක් වේද?"

"එසේය බුදුරජාණන් වහන්ස, අද සිට මා ඇතුළු අපේ පරම්පරාවම දස බවෙන් මුදවන බව සිටුතුමා පොරොන්දු වුණා."

"නැඟී සිටිනු නැගණියනි. යහපතක්ම වේවා" බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සඟ පිරිස නැවත හැරී ජේතවනාරාමයට වැඩි සේක. රැස්ව සිටි සියල්ලෝම සාදුකාර දුන්හ.

ලලිතකලාකීර්ති, චිත්‍රකලා ගුරු
ගොංගිතොට ප්‍රේමරත්න

"යකඩයෙන් හැඟුණු මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

දළදා වරුණ

මාධ්‍ය විකාශ විශේෂ කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk

## බුදු සසුන හා නිදහස

[illegible]

# අප සසරින් සසරට ගෙනයන පුරුදු








[illegible]

ධුරංග ජයවර්ධන

[illegible]



# ඔබත් මානාධික අයෙක්ද?

බර කිරීමට තරාදියත්, කාලය මැනීමට හෝරා යන්ත්‍රයත්, දිග පළල මැනීමට කෝදුවත්, ජලය මැනීමෙහිලා ජලමාපකයත් උපයෝගී කරගන්නා බැවින් ඒ සියල්ල මානයන්ය. කෙනෙකුත් උස් මිටිකම් හෙවත් උසස් පහත් බව පිළිබඳ මැනීමේ මානය නම් වූ මනෝභාවය පුද්ගලයාගේත්, සමාජයේත් සන්තානගත හා සමාජගත දුක් දොම්නස් හා පශ්චාත්තාපයටත්, සියලු ගැටුම්වලටත් හේතුවක් වන බැවින් අත්හල යුත්තකි. එය නිවනට බාධාවක් වන බැවින් ප්‍රහීන කළ යුත්තකි. සසර දිග්ගස්සන සංයෝජන ධර්මයකි. සිතෙහි ගැඹුරට කිඳා බැස ඇති ක්ලේශ ධර්මයකි. එබැවින් මානය මනාව හඳුනා ගැනීමට උත්සාහ දරමු.

''එයා හරිම මාන්නක්කාරයා'', ''හපෝ එයාගේ තියෙන ආඩම්බරේ. හැටි විතරක්. මූණෙන් හිනාවක්වත් නැහැ'', ''මම තමයි අහවල් එක්කෙනාගේ අහවලා. හිටපල්ලා මම කවුද කියා පෙන්නන්න.'', ''අපි නොදන්නවැයි උන්ගේ හැටි. අපි ඉතින් ඒගොල්ලන්ගේ අතපල්ලෙන් වැටුණු අයනේ'', ''අපි මහා පවිකාරයෝ...'' මේ හැම ප්‍රකාශයකම ඇත්තේ මානයයි. ඒ නිසා හැම ගැටුමකටම, හැම සමාජ අසාධාරණකමකටම, ඒ වගේම හැම කනස්සල්ලකටම මානය හේතුවක් වෙනවා. මානය ඇති කෙනාට සැනසිල්ලක් නැහැ. කාර්යාලයේදීත්, පන්සලේදීත්, සභාවේදීත්, ප්‍රිය සාදයේදීත් හැම තැනකම මානය ප්‍රදර්ශනය වෙනවා. විටෙක කෙනෙකු හෙලා දකිමින් තව පිරිසක් සිනා සෙනවා. මෙසේ තමා උසස් කොට, අනුන් පහත් කොට සලකන්නා වූ අත්තුක්කංසන පරවම්භන ස්වභාවය මානය ලෙස හඳුන්වන්න පුළුවන්.

මානය එකේ සිට දස වැදෑරුම් ආකාරයක් දක්වා අටුවා ග්‍රන්ථවල විස්තර කොට දක්වෙනවා. එක විටෙක 'මානෝ යා චිත්තස්ස උන්නති' මානය පොදුවේ උඩඟු බව නම් වූ මනෝභාවය හේතුකොට පවතින නිසා මානය එක් වැදෑරුම් කොට දක්වා තිබෙනවා. මානය දෙවැදෑරුම් කොට දක්වා තිබෙන්නේ, 1. තමා උසස් කොට සැලකීමත්, 2. තමා පහත් කොට සැලකීමත් නිසයි. මානය තුන් වැදෑරුම් කොට කරන විග්‍රහය මෙහිලා වැදගත් වේ. එනම් 1. තමා අනිකාට වඩා ශ්‍රේෂ්ඨය 2. තමා අනිකාට සමානය 3. තමා අනිකාට වඩා පහත්ය යනුවෙන් මේ ත්‍රිවිධ මානය හැඳින්වෙනවා. මානය සතර ආකාරයකට බෙදා දක්වන්නේ ලාභය, යසස, ප්‍රශංසාව හා සැපය යන කරුණු සතර නිමිති කර ගනිමින් ඇතිකර ගන්නා වූ මානය අවස්ථාවේදිය.

එසේම ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යනුවෙන් දක්වූ ඉන්ද්‍රිය සය නිසා ඇතිවන මානය සය ආකාරයක මානය ලෙස විග්‍රහ වෙයි. අටලෝ දහම අනුව මානය අටවැදෑරුම් ලෙසත්, මම ශ්‍රේෂ්ඨයාට වඩා ශ්‍රේෂ්ඨ වෙමි, මම ශ්‍රේෂ්ඨයා හා සමාන වෙමි.

"නිහතමානීව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

මම ශ්‍රේෂ්ඨයාට වඩා හීන වෙමි, ආදී වශයෙන් සෙය්‍යමානය, සම්මානය හා හීනමානය යන අවස්ථාවන්හි ඇතිකර ගන්නා වූ නව වැදෑරුම් මානය පිළිබඳවත් අවසාන වශයෙන් 1. ජාති කුල ගෝත්‍ර 2. රූපලක්ෂණ 3. පැහැපත් බව 4. ධනය 5. ඉගෙනීම 6. කර්මාන්තය 7. තමාගේ ගුරුකුලය හෙවත් පාසල 8. තමා උගත් විද්‍යාව 9. තමාගේ බහුශ්‍රැත බව 10. තම ප්‍රතිභාව හා නිර්මාණශීලී බව පිළිබඳව හටගන්නා වූ මානය නිසා මානය දස වැදෑරුම් කොටත් දක්වා ඇත.

මෙහිදී මානය පිළිබඳ වූ වඩා පැහැදිලි වන තුන් වැදෑරුම් මානය පිළිබඳ අවධානය යොමු කරමු.

1. **සෙය්‍යමානය - තමා අනිකාට වඩා උසස් යැයි ඇති මානය,**

2. **සදිසමානය - තමා අනිකාට සමාන යයි ඇති මානය,**

3. **හීනමානය - තමා අනිකාට වඩා පහත් යැයි සිතන මානය.**

සංයුක්ත නිකායේ V 56 දක්වෙන මෙම මාන තුනෙහිදී තමා අනුන්ට වඩා උසස් යැයි සිතමින් උඩඟු බවට පැමිණෙන සෙය්‍යමානය පළමුවැන්නයි. එය අධිමානය නමින්ද හැඳින්වේ. කුලය, නිකාය, ජාතිය, ප්‍රදේශය, පරම්පරාව, ධනය, බලය, යශ ඉසුරු, උගත්කම, ශිල්ප බලය, තරුණකම, රූපය, කටහඬ මේ තුමන හෝ කරුණක් නිසා සෙය්‍යමානය අත්විය හැක. සමාජය ඔවුන් පිළිබඳ හඳුන්වන උපහාසාත්මක 'මුදනා', 'මරවා' යන වදන් භාවිත කරන්නේ එවැනි අයටයි. සෙය්‍යමානය හෙවත් අධිමානය ඇති තැනැත්තා තමාගේ උසස් බව සිතා යුක්ති ධර්මයට, නීතියට, උගත්කමට, මනුෂ්‍යකමට ගරු නොකරයි. හිස උදුම්මාගෙන ක්‍රියාකරන එබඳු අය සමාජයේ පිළිකුලට ලක්වෙයි. කොතරම් උගත්, බලවත්, ධනවත් කෙනෙක් වුවත් ඔවුන් මානය නිසා හිස් බඳුන්වලට සමාන වේ. උඩඟු වීමට තරම් ලෝකයෙහි කිසිවක් නැති බව වටහා ගත් ශ්‍රේෂ්ඨ තැනැත්තා කොතරම් බලවත් කෙනෙක් වුවත් ඔහු තනතුරු, කීර් යසස්, ධන සම්පත් කොතෙක් ලැබුණත් කිරි වැදුණු ගොයමක් මෙන් නිහතමානී වෙයි.

සදිස මානයද අප හොඳින් හඳුනාගත යුතුය. තමාට වඩා උසස් අය දෙස බලා තමාගේත්, ඔහුගේත් අඩුවක් නැතැයි සංසන්දනය කරමින් සිතීම ස්වමානයයි. ඔහු ඒ සඳහා නොයෙක් තර්ක විතර්ක ගෙනහැර දක්වයි. ඔහුද ගරු කළ යුත්තාට ගරු නොකරයි. යුක්තියට, නීතියට, ධර්මයට හිස නොනමයි. ගුරුවරුන්වද, වැඩිහිටියන්වද නොසලකයි.

ආත්ම විශ්වාසය හා ආත්ම ගෞරවය ඔහු නොතකයි. සහාවේදී හැකිලෙයි. ඔහුගේ සිතුවිලි නිතරම පසුගාමී වේ. එබඳු අයගෙන් සමාජයටත්, එම පුද්ගලයාටත් යහපතක් ඇති නොවේ. අසත්‍ය හමුවේ මුනිවත රකින, අධර්මයට යටත් වී සිටින, අධාර්මික තැනැත්තාටත් යටහත් පහත්කම් පාන ඔහු හීනමානය ඇත්තෙකි. එය කුලය, බලය, ධනය, උගත්කම, රූපය වැනි කිසියම් කරුණක් නිසා හෝ කරුණු කිහිපයක් නිසා ඇති කරගත් අනවශ්‍ය වූ හීනමානයකි. මෙම ඉහත කී මාන තුනම නිවන් මගට බාධාවකි. ඒ මාන තුනෙන් සිටින තාක් කල් එබඳු අයට නිවන බොහෝ දුරය.

අප බෞද්ධ සමාජයක් යැයි කියන මේ සමාජ තුළ මානය කොතරම් මුල් බැසගෙන ඇති දැයි බලන්න. එය සමාජයේ ඉදිරි ගමනට කොතරම් බාධාවක් වී ඇත්ද?

මෙබඳු දෑ එළිපිට කතා කිරීමට බොහෝ දෙනා අකමැති වෙති. ඒ හීනමානය හෝ අධිමානය නිසාය. ජාතිවාදය, කුලවාදය, මේ බෞද්ධ යැයි කියන සමාජයෙහි කොතරම් කාවැදී තිබේද යන්න පත්තර පිටු පුරා ඇති ආවාහ විවාහ යෝජනාවන්ගෙන්ද, සංඝ සමාජයේ දක්නා ලැබෙන ප්‍රධාන නිකායන් තුන හා අනු කුඩා නිකායන්ගෙන්ද මොනවට පැහැදිලි වන්නේය.

ස්ත්‍රිය හා පුරුෂයා පමණක් නොව සියලු සත්වයන් කෙරෙහිම සමානාත්මතාවය පිළිගන්නා බැවින් බුදු දහමේ සමානාත්මතා සිද්ධාන්තයෙන් ස්ත්‍රිය හා පුරුෂයා පිළිබඳ සම මානයද ප්‍රතික්ෂේප වෙයි. ස්ත්‍රිය හා පුරුෂයා යන දෙදෙනාට කිසිදු වෙනසක් නැතිව නිර්වාණය අවබෝධ කරගැනීමට හැකි බව පිළිගන්නා බැවින් බුදු දහම විෂම වූ මානය කිසිසේත්ම නොපිළිගන්නා බව අප වටහා ගත යුතුය.

මේ අනුව තමා අනිකාට වඩා උසස්ය, තමා අනිකාට සමානය, තමා අන්‍යයන්ට වඩා පහත් යැයි සිතන වැරදි මානයන්ගෙන් මිදුණු නිහතමානී මිනිසකු වීමට අපි හැම දෙනා උත්සාහ කරමු.

**පූජ්‍ය විලේගොඩ අරියදේව හිමි**



22



## ගුත්තිල ජාතකයෙන් හෙළිවන

# ගුරු ගෝල බැඳීමේ උස් මිටිකම්

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

තුන්ලොවට ගුරු වූ, ප්‍රඥාව නිධාන වූ, මා පිය රැකුමෙහි අසමසම වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ සිටින කාලයෙහි දෙව්දත් තෙරුන් අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක. එක් දිනෙක භික්ෂූන් වහන්සේ, දෙව්දත් තෙරුන් අමතා ඇවැත්නි ඔබ සර්වඥයන් වහන්සේගෙන් ත්‍රිපිටකය දරන ලදී. සර්වඥයන් වහන්සේ නිසා චතුර්ථධ්‍යානයන් ලබන ලදී. එසේ තමන්ට බොහෝ උපකාරී වූ ආචාර්ය පදවියෙහි සිටින්නා වූ සර්වඥයන් වහන්සේට ඔබ හා සම කොට දොස් පවරන්නේ කෙසේදැයි විමසූහ. එය ඇසූ දෙව්දත් තෙරුන් භික්ෂූන් අමතා, සර්වඥයන් වහන්සේ මට මොන ලාභ සත්කාරයක් කළෙහිද? මම ම ත්‍රිපිටකය දැරීමි. ධ්‍යාන උපදවා ගතිමි. සර්වඥයන්වහන්සේ මට කිසිවක් කළේ නැතැයි පැවසූහ. මේ කතාව දම්සභාමණ්ඩපයට රැස්වූ සංඝයා වහන්සේ කතිකා කරමින් සිටි තැනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ, මහණෙනි, මා පැමිණීමට පෙරාතුව කුමන කතාවකින් යුක්තව සිටියේදැයි විචාළ සේක. එවිට දෙව්දත් තෙරුන් කී බස් අසා, ඔහු මෙම ආත්ම භවයේදී පමණක් නොව පෙර ආත්මභවයන්හි ද ගුරුවරයාට ආක්‍රෝෂ පරිභව කළෝ වේදැයි වදාරා භික්ෂූන්ගේ ආරාධනාව පරිදි මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක.

මෙම ජාතක කතාවේ අතීත කතාව නම් බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජු රජ කරන සමයෙහි බෝසතාණන් වහන්සේ ගාන්ධර්ව කුලයෙක ඉපිද වැඩිවිය පැමිණියේය. බෝසතාණෝ ගාන්ධර්ව ශිල්පය හදාරා නිමවා ගුත්තිල නම් වීණා වාදකයා ලෙස දඹදිව පුරා ප්‍රසිද්ධව, තම අන්ධ මව්පියන් රකිමින් සිටියහ. එසමයෙහි බරණැස් නුවර සිට උදේනි නම් උයනට පැමිණි වෙළෙඳුන් ඉස් සෝදා නා කා බී විවේකීව සිටින අතර අපට ගී කියන්ට වීණා වාදනය දන්නා කෙනෙකු කැඳවාගෙන එන්නැයි ඉල්ලූහ. යහපතැයි කියා උදේනි ගම් ගාන්ධර්වයන්ට නායක වූ මූසිල නම් ගාන්ධර්වයා එතැනට ගෙන්වා වෙළෙඳුන්ට නටා ගී කීමට සැලැස්වූහ. එහෙත් ඒ අසා සිටි වෙළෙන්දෝ සතුටු නොවුණහ. එවිට මූසිල මධ්‍ය ලයෙන් ද, විසේක උච්ච ලයෙන් ද වීණා වාදනය කරන්නට පටන් ගත් නමුත් වෙළෙන්දෝ සතුටු නොවූහ. එවිට මූසිලයා මොවුන් හැමදෙනා විශේෂයක් නොදන්නා අය වෙතැයි සිතා එසේනම් මමත් නොදන්නා මේ මිනිසුන්ට තනුරු කොට ගායනා කරන්නෙමැයි සිතා තනුරුව ගායනා කරන්නට පටන් ගත්තේය. එකල්හි ද කිසි කෙනෙක් සතුටු නොවූහ. එවිට මූසිල ගාන්ධර්වයා, තොප හැමදෙනා මා මෙසේ ගායනා කරද්දීත් බැණ නොවැදී ඉන්නේ කිසියම් විශේෂයක් නැති හෙයින්දැයි විමසූහ. නැත්නම් මට වඩා දක්ෂ ලෙස වීණා වාදනය කරන්නෙකු දැක ඇත්තේදැයි විචාලේය. එබස් ඇසූ වෙළෙඳුන් කියන්නේ, එම්බල මූසිලයාණෙනි, ගුත්තිල නම් ගාන්ධර්වයාගේ වීණා නාදය ඇසුවා වූ අපට තොපගේ වීණා නාදය උණපත්තක ගාන්නාක් වැනිය. එවිට මූසිල, එසේනම් ඔබ හැම බරණැස් නුවරට යන විට මා ද කැන්දාගෙන යන්නැයි ඉල්ලා සිටියේය. එම ව්‍යාපාරිකයෝත් ඔහුගේ බස අසා තමන් සමග මූසිල නම් ගාන්ධර්වයාත් කැඳවාගෙන ගොස් ගුත්තිල ගාන්ධර්වයාගේ නිවස පෙන්වූහ.

ඔහු යන වේලාවෙහි බෝසත්තුමන් නිවසේ නොසිටියේය. එවිට මූසිල ගුත්තිල පඬිතුමන්ට අයත් අසල තිබූ වීණාව ගෙන වාදනය කරන්නට පටන් ගත්තේය. එය ඇසූ අන්ධ දෙමව්පියෝ අපගේ දරුවාගේ වීණාව මීයන් එක්ව කපන සැටි ඇසෙයි යයි පැවසූහ. එවිට මූසිලයා දෙමව්පියන්ට වැඳ ඔබලාගේ පුතණුවන් කොහිදැයි විචාළහ. දෙමව්පියන් ද දැන් දරුවා එනු ඇත. මෙතන ඉන්නැයි පැවසූහ. ඒ අතර බෝධිසත්වයෝ එතැනට පැමිණියහ. එවිට මූසිලයා බෝධිසත්වයන්ට වැඳ ශිල්ප උගන්වන්ට යැයි ඉල්ලා සිටියේය. බෝධිසත්වයන් ශාරීරික ලක්ෂණ ගැන දන්නා හෙයින්, මේ අසත්පුරුෂයෙක් බව දැන, ඔබට දීමට මට විද්‍යාවක් නැත, පලායන්නැයි කීහ. මූසිලයා බෝධිසත්වයන් නොකැමැති වුවත්, බෝධිසත්වයන්ගේ දෙමව්පියන්ගේ සිත් ගෙන, තුම්ලාගේ පුතණුවන්ට කියා මට ශිල්ප ලබා දෙනු මැනවැයි යාඥා කළේය. බෝධිසත්වයන්ගේ දෙමව්පියෝත් තම පුතණුවන් අමතා මොහුට ශිල්ප උගන්වන්නැයි ඉල්ලා සිටියහ. බෝධිසත්වයන් දෙමව්පියන් කී දෙය නොඅසා සිටිය නොහැකි බැවින්, යහපතැයි කියා ආචාර්යභාග නොතබාම ශිල්ප නිමාවටම විද්‍යාව උගැන්වූහ.

බෝධිසත්වයන් වහන්සේ රජු දක්නට යන විට අතවැස්සා ද කැඳවාගෙන ගියහ. රජු මොහු කවුරුන්දැයි විචාළ කල්හි දේවයන් වහන්ස, මගේ අන්තේවාසිකයෙකැයි කීහ. රජු කල්යාමේදී ඔහු හා විශ්වාස විය. බෝධිසත්වයෝ, දරුව තොපට වඩා මම විද්‍යාව නිමවා දනිමියි කීය. දවසක් මූසිල ගාන්ධර්වයා සිතන්නේ, මම වෙනත් නුවරකට ගොස් ජීවත් වනවාට වඩා ආචාරීන් වයෝවෘද්ධ නිසා ඇමටම ප්‍රධාන වූ බරණැස් නුවරම හිඳිමියි සිතා, බෝධිසත්වයන් අමතා, ආචාර්යන් වහන්ස, රජුට සේවය කරන්නට මම ද කැමැත්තෙමැයි කියා, මට පඩියක් සලස්වන්නැයි ඉල්ලා සිටියහ. බෝධිසත්වයෝත් රජුට ගොසින් කියම්යි සිතා කැඳවාගෙන ගොස්, දේවයන් වහන්ස, මගේ අන්තේවාසිකයා තුම්වහන්සේට සේවය කරන්නට කැමතිය. ඔහුට පඩියක් නියම කරන්නැයි දැන්විය. එවිට රජතුමා, ඔබගේ පඩියට භාගයක් නියම කරමියි කීය. එපවත් ශිෂ්‍යයාට කී විට, මාත් ශාස්ත්‍ර හරියට දනිමි. එසේ බැවින් පඩිය අඩු කිරීමට හේතුව කුමක්දැයි විමසීය. එය ගොස් රජතුමාට කී විට, රජතුමා මූසිල අමතා, ඔබ හරියට විද්‍යාව පාන්නේ නම් ඒ නියාවට පඩි දෙමැයි පැවසීය. බෝධිසත්වයෝ එපවත් ශිෂ්‍යයාට කීවේය. ශිෂ්‍යයා විද්‍යාව නිසිලෙස පාමියි කීහ.

රජු බෝධිසත්වයන්, ශිෂ්‍යයාත් ළඟට ගෙන්වා, ශිෂ්‍යයා අමතා, එම්බල තොප විසින් ගුත්තිල නම් ගාන්ධර්වයන් හා හැටුව වාද කරන්නට පිළිවන්දැයි විමසීය. එවිට මූසිලයා මාත් විශේෂ කොට ශාස්ත්‍ර දනිමි. අදින් සත් දවසක් ගිය තැන තරග වාද කොට දක්වමි. රජ්ජුරුවෝ ගුත්තිල හා මූසිල දෙදෙනා සත්දිනෙකින් පසු නුවර සැලකළහ.

රජ්ජුරුවෝ ගුත්තිල හා මූසිල දෙදෙනා සත්දිනෙකින් පසු නුවර සැලකළහ. එබැවින් බෝධිසත්වයෝ සිතන්නේ, බෝධිසත්වයෝ මා වයෝවෘද්ධය, තරග කළ නොහැකිය. මොහු හා තරග කොට පැරදෙනවාට වඩා දිවි නසා ගැනීම යහපතැයි සිතා ලැජ්ජාවෙන් මිරිකුනහ. මරණ බයින් ගෙට ගියහ. මේ අයුරින්, සත් දවසක් ගෙවී යාමෙන් ප්‍රාණය නසාගන්ට ගිය කල්හි, ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවිය. ශක්‍රයෝ දිවැසින් බලා, බෝධිසත්වයන්ගේ වික්ෂෝපය දැක, එතැනට අවුත් ආචාර්යනි, මෙතනට එනු මැනවැයි කීහ. එවිට ගුත්තිල පඬිතුමා ඔබ කවරෙක්දැයි විමසූ විට, මම දෙදෙව්ලොවට අධිපති ශක්‍රයෝ වෙමියි කීහ. එවිට බෝධිසත්වයෝ මගේ ගෝලයා හා වාද කිරීමට මම යමි, ඔබ මට සහය වූ මැනවැයි ඉල්ලා සිටියේය. එකල්හි ශක්‍රයා මම ඔබට උපකාරී වෙමි, උන් හා සමග හරිහරියට විද්‍යාව පාන්නැයි කියා, මා සංඥා කළ කල්හි වීණාවේ තත් කඩා පියා, ඒ තත සිඳින විට පළවෙනියාගේ නාදය වැඩිවන්නේය. ඒ අනුව ඒ ඒ තත සිඳින්ම

ඔහුගේ තත් සතෙහි නාද අඩු වේ. එවිට මෙම පස ඇට තුන එකින් එක ආකාශයට දමන විට තවසියක් ස්ත්‍රීන් නටන්නාහ. ඔබත් එතනට එන්නෙම් වේදැයි කීය. සියලු නගරවැස්සෝ හෙට ගුත්තිල ගාන්ධර්වයා හා මූසිල අතවැස්සා යන දෙදෙනා තරඟ වීණා වාදනය කරන්නේ යැයි රැස්ව සිටියහ.

බෝධිසත්වයෝත් තමන්ගේ වීණාව ගෙන පැනවූ අස්නෙහි සිටියහ. මූසිලයාත් තමන්ට පැනවූ අස්නෙහි හුන්නේය. බොහෝ මනුෂ්‍යයෝත්, රජුත් පැමිණි අතර, ශක්‍රදේවේන්ද්‍රයා අදෘශ්‍යමානව සිටියේය. ශක්‍රයා පැමිණි බව බෝධිසත්වයා පමණක් දන්නේය. අතවැසියා හා බෝධිසත්වයෝ වීණාව සමව ගැසූහ. බොහෝ දෙනා වීණාව ගැසූ අපූරු දැක සතුටුවූහ. එවිට ශක්‍රයාගේ සංඥාවත් සමඟ බෝධිසත්වයෝ පළමු තත කැඩූහ. එවිට කැඩුණු තතෙන් පෙරටත් වඩා නාදය නික්මිණ. ඒ දැක මූසිල ගාන්ධර්වයාත් තත් කැඩීය. ඒ හඬ, තත කැඩූ විට අඩු විය. මේ අයුරින් දෙවන තුන්වන ආදී වශයෙන් සත්වන තත දක්වා කඩා ගුත්තිල පඬිතුමා වීණා දණ්ඩේ වීණා ගාන්ට පටන් ගත්තේය. එවිට බරණැස් නුවර එක නින්නාදව ඇසෙන්නට පටන් ගත්තේය. මූසිලයාත් ඒ නියාවට තත් සතම කඩා නාද කරන්නට පටන් ගත් නමුත්, උණපත්තක් 'අතගාන්නාක් මෙන් නිශ්ශබ්ද විය. එවිට බෝධිසත්වයෝ ශක්‍රයා දුන් පස ඇට තුනෙන් එකක් අහසට දැමූහ. තුන්සියක් දිව්‍ය ස්ත්‍රීන් නටන්නට වන්නාහ. දෙවෙනි පස ඇට දැමූ කල්හි තවත් තුන්සියක් දිව්‍ය ස්ත්‍රීන් නටන්නට පටන් ගත්තාහ. මේ අයුරින් දිව්‍ය ස්ත්‍රීන් තුන්සියයක් නටන්නට පටන් ගත්තාහ. බෝධිසත්වයෝ මියුරු ගීතිකා කිය කියා වීණා වාදනය කළහ. ඒ දුටු රජු හා මනුෂ්‍යයෝ සතුටුවූහ. මූසිල හා කිපුණු රජු අමාත්‍යයන්ගේ මුහුණ බැලූ විට, ඔවුන් රජුගේ අභිප්‍රාය දැක ආචාරීන්ට ද්‍රෝහිකම් කරන ලදැයි, තමන්ගේ අත තිබූ කැට මුගුරුවලින් තලා පය අල්වා ඉවත දැමූහ. රජු බෝධිසත්වයන් කෙරෙහි සතුටු වූහ. සත්රුවන් ආදී ප්‍රසාද දුන්හ. නුවර වාසීහු බොහෝ සම්පත් දුන්හ. ශක්‍රයෝත් මා විසින් තොපගේ ගෙට වෛජන්ත රථය එවමි. තොප එහි නැගී මා කරා එන්නැයි කියා දිව්‍ය ලෝකයට ගියහ.

දිව්‍ය ස්ත්‍රීන් ද වීණා වාදනය අසනු රිසි වූයෙන් මාතලී දිව්‍ය පුත්‍රයා අත වෛජන්ත නම් රථය යැවූ විට බෝධිසත්වයෝ වීණා වාදනය කරන්නට එනැයි සිතා දෙව්ලොව රැස්වූහ. වීණා වාදනය අසා සිටි දිව්‍ය ස්ත්‍රීන් සම්පත් දීමට සැරසුණු විට මට සම්පත් අවශ්‍ය නොවේ, දිව්‍ය ස්ත්‍රීන් කළ පින් ඇසීමට කැමැත්තේමැයි කීවෙන් ඔවුනොවුන්ගේ පින්කම් ගැන ඇසූහ.

එක් දිව්‍ය ස්ත්‍රියක් මනුෂ්‍ය ආත්මභාවයේ දී කාශ්‍යප සම්බුද්ධරජාණන් වහන්සේගේ ශාසනයෙහි රහත් නමකට පිළිසඟලක් දීමෙන් එහි විපාක වශයෙන් දෙව්ලොව උපන් බව පැවසුවාය. එසේම සෙස්සන් අතින් ද එසේම විමසූ විට අනෙක් අය ද තම තමන් කළ කුසල් කීහ. එක් තැනැත්තියක් මල් කලඹක් පුදා දිව්‍ය ලෝකයේ උපන්නැයි කීවාය. තවත් කෙනෙක් දාගැබකට සුවඳ පසඟුල් දී මෙහි උපන් බව පැවසුවාය. තවත් කෙනෙක් සුවඳ බඩුවක් දන් දී දෙව්ලොව උපන් බව පැවසූහ. තවත් දෙවඟනක් මිහිරි පලාඵල දන් දී දිව්‍ය ලෝකයේ උපන් බව පැවසුවාය. තවත් දෙවඟනක් කාශ්‍යප බුදුන්ගේ දාගැබකට පසැඟුල් දී දෙව්ලොව උපන් බව පැවසුවාය. තවත් දෙවඟනක් මංමුලාවී ආ භික්ෂූන් වහන්සේ නමකට දන් දී බණ අසා දෙව්ලොව උපන් බව දැන්වූවාය. තවත් දෙවඟනක් නැවෙක යන භික්ෂූන් වහන්සේ නමකට පැන් පිළිගන්වා ද, තවත් දෙවඟනක් නැඳි මයිලන් ආක්‍රෝශ පරිභව කරද්දී මෛත්‍රී කොට ද, තවත් දෙවඟනක් තමාගේ බත් කොටස දන්දීමෙන් ද දෙව්ලොව උපන් බව කීවාහුය.

බෝධිසත්වයන් වහන්සේ මිනිස ලෝකයට අවුත් දෙව්ලොව පුවත් බොහෝ දෙනාට පවසා තවත් පින්කමෙහි යෙදුණාහ. එසමයෙහි මූසිල නම් ගාන්ධර්වයා දෙව්දත් තෙරුන්ය. බරණැස් නුවර රජු ආනන්ද ස්ථවිරයන් වහන්සේය. ශක්‍රයා නම් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේය. ගුත්තිල පඬි නම් බුදු බව ලැබූ මම ම යැයි දක්වා වදාළ සේක.

ගුත්තිල ජාතක කතාවෙන් හෙළි වන සුදන දුදන ගති මැනවින් හඳුනාගෙන දුදනන්ගෙන් මිදී කෘතඥණවේදී දහමින් ජීවිතය සරසා ගෙන මව්පිය ගුරු දෙගුරුන් සමව සලකමින් සාරධර්මයන්ගෙන් ජීවිතය සරසා ගැනීමට අපිදු අදිටන් කර ගනිමු.

**කේ. මීගහකුඹුර**



# බුදු දහමේ ඉගැන්වෙන අනාත්ම සංකල්පය විද්‍යාව අනුව තේරුම් ගන්නේ කොහොමද?




මේ ලෝකයේ පිරී පවතින්නේ ශක්තීන්ගෙනි. අප නොදන්නා නමුත් අප අවට ගිණිය නොහැකි තරම් ශක්තීන් ප්‍රමාණයක් විසිර පවතී. මේ ශක්තීන් පවතින්නේ තරංග (Wave) ආකාරයටය. තරංග ඇතිවන්නේ චලිතයෙනි. (කම්පනයෙනි - Vibration) අපට අවට ඇති ලොකු කුඩා, ජීවී අජීවී සෑම වස්තුවකම අංශූන් ඊට අදාළ සංඛ්‍යාතයකින් (Frequency) කම්පනය වෙයි. එම තරංග අප අවට ඇත.

මෙයට අමතරව ගුවන් විදුලි තරංග, රූපවාහිනී තරංග, දුරකථන තරංග, පාරජම්බුල (Cosmic) සහ ශබ්දය, ආලෝකය, විදුලිය ආදී නොයෙකුත් තරංග (ශක්තීන්) අප අවට ඇත.

මේ ශක්තීන්ගෙන් ඉතාමත් සුළු ප්‍රමාණයක් හඳුනා ගැනීමට අපගේ සඳී (6) ඉන්ද්‍රියයන්ට හැකිවේ. ශබ්ද තරංග හඳුනා ගැනීමට කනද, ආලෝක තරංග සඳහා ඇසද, ඒ ඒ රසායන ද්‍රව්‍යවලින් පිටකරන තරංග සඳහා දිව සහ නාසයද, උෂ්ණය, සීතල, පීඩන ආදී නොයෙක් තරංග සඳහා සමද, මානසික ශක්තීන් සඳහා සිතද ඇත.

ඒ ඒ ශක්තීන්ගෙන්ද (තරංග) අපට හඳුනා ගත හැක්කේ ඉතාමත් සුළු කොටසකි. උදාහරණ වශයෙන් අපගේ කනෙන් හඳුනාගත හැක්කේ දළ වශයෙන් සංඛ්‍යාතය 20 ත් 20,000 ත් අතර ඇති කම්පන පමණි. (සංඛ්‍යාතය යනු තත්පරයකට ඇතිවන කම්පන සංඛ්‍යාවයි) ඉන් ඉහළ හෝ පහළ හෝ සංඛ්‍යාත ඇති තරංග අපගේ කනෙන් හඳුනාගත නොහැකිය.



ආලෝකයද එසේමය. අපගේ ඇස මගින් හඳුනාගත හැක්කේ ඉතාමත් සුළු තරංග පරාසයක් පමණි.

උදාහරණ වශයෙන් කනෙහි ක්‍රියාකාරීත්වය සිදුවන්නේ මෙසේය.

ඇතුල් කනෙහි, කර්ණශංඛය නමැති හැකිලී ඇති දිගු නාලයක් ඇත. එහි ඇතුළත පිරී ඇති ද්‍රව්‍යයක සෛල විශේෂයක් පාවෙමින් පවතී. මේ සෛල කම්පනය වන සංඛ්‍යාත එකිනෙකට වෙනස්ය. බාහිර කනෙහි ඇති කන් බෙරය, පිටතින් එන තරංග සංඛ්‍යාත අනුව සිදුකරන කම්පනය, කර්ණශංඛය කරා ගියවිට එම සංඛ්‍යාතයෙන්ම අදාළ සෛල පමණක් කම්පනය වෙයි. එසේ සිදුවන කම්පනයට සමාන කම්පනයක් මීට කලින්ද ඇතිවී නම්, එවිට අප ඒ සඳහා සංඥවක් (ආත්මයක්) දී තිබුණා නම්,නැවත එම කම්පනය ඇතිවන විට අප එය එම ආත්මය ලෙස හඳුනා ගනිමු.

උදාහරණ වශයෙන් අම්මා කතා කරන හඬ අප හඳුනා ගන්නේ, එම ශබ්දයේ සංඛ්‍යාතය අනුව කම්පනය වන සෛලයන්ට අප අම්මා යයි ආත්මයක් දී ඇති නිසාය. අපගේ අම්මාගේ හඬ වෙනත් බාහිර පුද්ගලයෙකුට හඳුනාගත නොහැක්කේ ඔහු එයට ආත්මයක් දී නැති නිසාය. එය ඔහුට ශබ්දයක් පමණි. තවද අප නොදන්නා බසකින් වෙනත් කෙනෙකු කතා කරන විට අපට එය ශබ්දයක් පමණි. ඒ අපි එම ශබ්දයට ආත්මයක් දී නැති නිසාය. සතෙකුගේ හඬ අප හඳුනා ගන්නේද ඊට කලින් එම ශබ්දයට ඒ ඒ සතාගේ නමින් අප ආත්මයක් දී ඇති නිසාය.

මෙසේ අප හඳුනා ගන්නා සියලුම ශබ්දයන්, අප හඳුනා ගන්නේ ඊට කලින් එම ශබ්දයන්ම ආත්ම දී ඇති නිසාය. එහෙත් ශබ්දයට ආත්මයක් නැත. එය අනාත්මයය. එය ශක්තියක් පමණි. මේ අනාත්ම ශබ්දයට අප ආත්ම දී ඇත. අපගේ ඇසට පෙනෙන දේද, සිදුවන්නේ මේ ආකාරයටමය. ආලෝකයේ ඇති ඒ ඒ වර්ණයන්ට සංඛ්‍යාත ඇත. ඇස සංවේදී වන්නේ එම සංඛ්‍යාතයන්ට පමණය. එම වෙනත් සංඛ්‍යාතයන්ට අප රතු, කහ, කොළ ආදී වශයෙන් ආත්ම දී ඇත. ඒ අනුව අදාළ සංඛ්‍යාත ඇසට යොමුවූ විට අප එම වර්ණය හඳුනා ගනිමු. ජීවී, අජීවී රූප හඳුනා ගන්නේද මේ ආකාරයට අප එම ආලෝකයේ සංඛ්‍යාතයන්ට දී ඇති ආත්ම අනුවය. එහෙත් ආලෝක තරංගවලට ආත්ම නැත. අනාත්ම ආලෝක තරංගවලට අප ආත්ම දී ඇත.

අපගේ සෑම ඉන්ද්‍රියයන්ටම ගෝචර වන්නේ බාහිරින් ලැබෙන ශක්ති තරංගයන්ය. ඒ සෑම ශක්ති විශේෂයකටම අප කුඩා කාලයේ සිටම ආත්ම දී ඇත. රස, ගඳ, සුවඳ, උෂ්ණ, සීත මේ සෑම දෙයක්ම අප හඳුනා ගන්නේ එසේය. අනාත්ම දෙයකට අප ආත්ම දී ඇති නිසාය.

ඔබ අසා ඇති බුදු දහමේදී අපට හමුවන දාරුචීරය ගැන බුදුන් වහන්සේ ඔහුට වදාළේ,

"දිට්ඨෙ දිට්ඨ මත්තං
සුතේ සුත මත්තං
මුතේ මුත මත්තං..." ආදී වශයෙනි.

මෙයින් අදහස් වන්නේ "දක්කොත් දක්කා පමණයි... ඇසුණොත් ඇසුණා පමණයි... දැනුණොත් දැනුණා පමණයි..."

මෙහි අර්ථය "දකින දෙයට ආත්ම දෙන්න එපා... ඇසෙන දෙයට ආත්ම දෙන්න එපා" යන්න නොවේද? එසේ ශබ්දයට, ආලෝකයට හෝ වෙනත් ශක්තියකට හෝ ආත්මයක් දෙන්නේ එයට ඇති ආශාව, කැමැත්ත, අකමැත්ත තොරසේ නම් ඒ සඳහා අපගේ ඇති ලෝභය, ද්වේශය, මෝහය නිසාය.

දාරුචීරියට අනාත්මතාවය අවබෝධ වූයේ ඒ අයුරිනි. අර්හත් තත්ත්වයට පත් වීමටද එමගින් දාරුචීරියට අවස්ථාව ලැබිණ.

අර්හත් වීමට නම්, ලෝකය අනිත්‍ය වශයෙන් හෝ දුක වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ අවබෝධ කළ යුතු බව මින් පෙනී යයි.

ලෝකයේ ඇති අනාත්මතාවය අවබෝධ කරගෙන දාරුචීරිය අමා මග නිවන සාක්ෂාත් කරගත් පරිද්දෙන් ඔබද ඒ නිවන් මග සොයා යා යුතුය.

විද්‍යා ආචාර්ය සිසිර ඉද්දමල්ගොඩ



## ආදාහන මළුව හා බැඳුණු මහනුවර රජ සමයේ

# රාජකීය අවමඟුල් චාරිත්‍ර විධි

මහනුවර රජකළ රජවරුන් මියයාමෙන් පසු ඔවුන්ගේ මළ සිරුරු ආදාහනය කළ හා භූමදානය කළ ස්ථානය ආදාහන මළුව වශයෙන් හැඳින්වේ. මහනුවර ත්‍රිකුණාමලය වීදියේ බටහිර දෙසින් හා ත්‍රිත්ව විද්‍යාලය ඉදිරියෙන් අස්ගිරි මහාවිහාරයට යන අධිපාරේ යාබද ගෙඩිගේ විහාරයට ආසන්නව ආදාහන මළුව පිහිටා ඇත.

ක්‍රි.ව 1371 සිට 1378 දක්වා රජකළ වික්‍රමබාහු රජතුමාගේ මෑණියන්ගේ සිරුරද ආදාහන මළුවේදී ආදාහනය කළ බවට ඉතිහාසයේ සඳහන් වේ.

ක්‍රි.ව 1604 දී මිය ගිය විමලධර්ම රජු (දොන් ජුවන්) ගේ මළසිරුර ආදාහනය කරන තෙක් ශ්‍රී ලංකාවේ රජ කළ වෙනත් රජවරුන්ගේ මළසිරුරු මෙම ආදාහන මළුවේදී ආදාහනය කළ බවට ලේඛනගත සාක්ෂි නොමැත. විමලධර්මසූරිය රජුගේ ආදාහනය චාරිත්‍රානුකූලව අති උත්කර්ෂවත් අන්දමින් පවත්වා ඇත. විමලධර්ම රජු (දොන් ජුවන්) හා දෝන කතිරිනාගේ පුත්‍රයා වූ මහිස්තාන් (Mahistan) 1612 වර්ෂයේදී මියගිය අතර ඔහුගේ ආදාහනය සිදුකළ ආකාරය වැලැන්ටින් වාර්තාවල (Valentyn Records) මෙලෙස සඳහන්ව ඇත.

ඔහුගේ මළසිරුර පිළිබඳ ආදාහනය රාජකීය උත්සවාකාරයෙන් සිදුකරන ලදී. මළසිරුර මහාශෝකාලාපයකින් යුතුව චිතකය කරා ගෙන යන ලදී. මහාශෝකාලාප සංගීතයක් මුසුකරමින් හලා සහිත සංගීත කණ්ඩායමක් මළ සිරුර ඉදිරියෙන් ගමන් කොට අඩි 07 ක් පමණ උසකින් චිතකය මත මළ සිරුර තැන්පත් කරන ලදී. මෙම චිතකය පියවර 07 ක් පමණ උසකින් පිහිටා ඇත. චිතකය මැද විශාල කුහරයකින් යුක්ත අතර සුවඳ දර සමගින් අතිරස හා සුවඳ ධූපයන් කුරුඳු ආදිය අසුරා තිබිණි. මෙයට අමතරව චිතකය තුළ කුහරයට ඇතුළතට ගෙන සුවඳැති දර හා සුවඳ කුළුබඩුවලින් සාමාන්‍ය මිනිසෙකුගේ උස ප්‍රමාණයට අසුරා තිබිණි. මෙයට අමතරව කුරුඳු තෙල් කළ 03 ක් හා පිතෙල් කළයක් චිතකය මැද කුහරයට දමන ලදී. මෙසේ දමන ලද තෙල් පැය භාගයක පමණ කාලයක් ගිනි ගෙන දැවීමට ඉඩහැරිණි. මිනිවලට අඩි 07 ක් පමණ උසින් කුලුනක ආකාරයකට වටිනා රනින් නිමා කරන ලද ඇඳුමින් වියනක් නිම කර ඉතා උසස් වංශවත් ආකාරයට අවමංගල්‍ය උත්සවය සමරන ලදී.


වැලන්ටින්ගේ වාර්තාවේ සඳහන් අන්දමට දෝන කැතරිනා බිසව 1613 ජූලි මස 20 දින මියගොස් ඇති අතර ඇයගේ ආදාහන උත්සවය 1613 ජූලි මස 21 වන දින මහා උත්සවාකාරයෙන් පවත්වා ඇත. ඓතිහාසික වාර්තා අනුව පසු කාලයේ රජකම් දැරූ රජවරුන්ගේ ආදාහන උත්සවයන් පවත්වා ඇත. 1635 දී සෙනරත් රජු, 1687 රාජසිංහ රජු, 1707 දී දෙවන විමලධර්ම රජු, 1739 දී නරේන්ද්‍රසිංහ රජු, 16747 දී ශ්‍රී විජය රාජසිංහ රජු, 1780 දී කීර්ති ශ්‍රී රජු හා 1798 දී රාජාධිරාජසිංහ රජුගේ ආදාහනයන් ආදාහන මළුවේදී සිදුකර ඇත.

ආචාර්ය ඩේවිගේ වාර්තා අනුව,

"රජ කෙනෙකු මියගිය බව ප්‍රකාශයට පත්කළ විට රජ මාලිගාවේ මහජනයා හමුවන ස්ථානය ඉදිරිපිට කුඩාරමක් ඉදිකර වී ගොඩකර ඒ අසල සිට බෙරවාදනය කරමින් රජුගේ මරණය පිළිබඳව සංඥාවක් මහජනයාට නිකුත් කරනු ලැබේ. මේ සංඥාව සමගින් රජයේ ප්‍රධාන නිලධාරීන් හා ප්‍රභූන් කළු පැහැති ඇඳුමකින් සැරසී මහජනයාට ඔවුන්ගේ ශෝකය උස් හඬින් ප්‍රකාශ කිරීමට දන්වා සිටී. රජ කෙනෙකුගේ මරණය සිදුවූ අවස්ථාවකදී රාජකුමාරයා කිසිදු ආහාර පානයක් නොගෙන සිටීම චාරිත්‍රයක්ව පවතී. රජුගේ මළසිරුර රන් සිවිගෙයක තබාගෙන රාජ්‍ය ප්‍රධානීන්, සිරින්දුවරුන්, දූවරුන් කැටුව ආදාහන මළුව කරා රැගෙන යනු ලැබේ. අවමංගල්‍ය පෙරහරේ දෝලාවක්/මැස්සක් මත තැගුණු ගැහැනුන් දෙදෙනකු හිඳුවා ගෙන මිනිසුන් 04 දෙනෙකු විසින් දෝලාව ඔසවා ගෙන ගිය අතර එම කාන්තාවන් විසින් මිනී පෙට්ටියට සහල් ඉසින ලදී. විහාරස්ථානවල මහා සංඝයා වහන්සේලාද අවමංගල්‍ය උත්සවයට වැඩම කළ අතර මතක වස්ත්‍ර පූජාව රජුගේ සංසාර ගමනට පින් පෙත් පැමිණවීම මහා සංඝයා විසින් සිදුකරනු ලැබේ. මිනී පෙට්ටිය චිතකය මත තැන්පත් කොට දරවලින් ආවරණය කොට තෙල්

"වැඩිහිටියන්ට අනීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුප්ත ජාතකය"





චන් කර සඳුන් හා වෙනත් සුවඳ දැ එක් කරනු ලැබේ. විහාරය ගිනි දැල්වූ පසු ඉන් ඉවත්ව යන පුහුන් කිසිදු ආහාරයක් ගැනීමෙන් වැළකී සිටින කුමාරයා හමුවට ගොස් විහාරයට ගිනි දැල්වූ බවත් නිවෙස් කරාගොස් පිරිසිදු වන ලෙස දන්වා සිටියි. විහාරය දින 11 ක කාලයක් බෙරකරුවන්ගේ තූර්ය වාදනයක් සමග ගිනිගැනීමට සලස්වනු ලැබේ. රාජ්‍ය ප්‍රධානීන් හා පුහුන් මුලක් පුවක් හා වෙනත් එවැනි දෑ රැගෙන මිය ගිය රජුට පිළිගැන්වීම සඳහා රැගෙන යනු ලැබේ. මෙසේ දැල්වෙමින් තිබූ විහාරය කිරි හා පොල් වතුර දමා නිවනු ලැබේ. නිවුණ විහාරයේ ඇති පිළිස්සුණු ඇට කැබලි මුට්ටියකට එක්රැස් කොට මුද්‍රා තබනු ලැබේ. ඉතිරි භස්මාවශේෂ හා පිළිස්සී උණු වී ගිය රත්තරන් හා තඹාග තවත් මුට්ටියකට එක්රැස් කරනු ලැබේ. භස්මාවශේෂ එක්රැස් කර මුද්‍රා තබන ලද මුට්ටිය මුහුණ ආවරණය කර ගත් පුද්ගලයෙක් අනෙක් අතින් කඩුවක් අතැතිව ඇතෙකු හෝ අශ්වයෙක් පිට නැගී ප්‍රධානීන් හා පුහුන් සමග මහවැලි ගඟේ කටුගස්තොට තොටුපොළ දක්වා ගමන් කරයි. කටුගස්තොට තොටුපොළේ ලතා මණ්ඩපයක් සේ සකස් කර කුඩා බෝට්ටු/පාරු දෙකක් එකට ගැට ගසා තිබේ. මුහුණ ආවරණය කරගත් පුද්ගලයා එක් බෝට්ටුවකට නැගුණු පසු කිමිනුම්කරුවන් දෙදෙනෙකු විසින් බෝට්ටුව ගඟ මැදට තල්ලු කර ගඟේ ගැඹුරු ස්ථානයක් කරා ගෙන යනු ලැබේ. ඊට පසු මුහුණ වසාගත් පුද්ගලයා ක්ෂණිකවම තම අත තිබූ කඩුවෙන් භස්මාවශේෂ මුට්ටිය දෙකඩ කඩා ගඟට වැටීමට සලස්වනු ලැබේ. මුහුණ වසාගත් පුද්ගලයා භස්මාවශේෂ ගසා ගෙන යන ජල පහර සමග පිහිනා ගොස් විරුද්ධ දිසාවේ ඇති ගං ඉවුරට ගොඩ වී අතුරුදන් වී යනු ලැබේ. කුඩා බෝට්ටුව ගඟ පහළට ගසා ගෙන යාමට ඉඩ හරියි. භස්මාවශේෂ ගෙනා ඇතා හෝ අශ්වයා නැවත කිසිම කටයුත්තකට යොදා නොගෙන කැලෑවට මුදාහරිනු ලැබේ. මිනී පෙට්ටියට කාල් ඉසින ලද කාන්තාවන් දෙදෙනා හා ඔවුන් දෝලාවෙන් ඔසවා ගෙන ගිය පිරිමි 4 දෙනාද ගං ඉවුරේ විරුද්ධ දිසාවට ගෙන ගොස් මුදාහරිනු ලබන අතර ඔවුන්ට ආපසු පැමිණීමට අවසර නොලැබේ. ප්‍රධානීන් සියලු දෙනාම ආපසු රාජ මණ්ඩපයට ආපසු පැමිණ අවමඟුල් උත්සවය අවසන් බව රාජ කුමාරයාට දන්වා අනතුරුව සියල්ලන්වම ජල ස්නානය කර පිරිසිදු වන ලෙස දන්වා සිටියි. මියගිය අධිරාජයාගේ/රජුගේ ආසන්නතම ඥාතියෙකු රාජ කුමාරයා සමඟින් කළු ඇඳුමකින් සැරසී ශෝකයෙන් යුතුව රාජ සභාවට පැමිණේ. නොවේස්නම් රාජ කුමාරයා කළු ලේන්සුවකින් හිස ආවරණය කර ගෙන රාජ සභාවේ පෙනී සිටියි."

මේ පිළිබඳව පරණවිතාන මහතාගේ මතය වන්නේ, ආදාහන උත්සවයට අවසන් කිරීමට දින 12 ක් ගතවන බවය. අවමංගල්‍ය උත්සවය කටයුතු සිදුකරන්නේ අළුපොළ නමැති ග්‍රාමයේය. (මෙම ග්‍රාමය පසුකලකදී පරාජ්පොල යනුවෙන් හැඳින්වේ.) 12 වන දිනයේදී රාජකීය ගබඩාවේ නිලධරින් විසින් අලුත් මුට්ටි 04 ක් විහාරයට රැගෙන යනු ලැබේ. අළුපොළ ගම්වාසීන් විසින් විහාරයේ ඇති දැවුණු ඇටකටු පළමුවැදදෙවනුව අළුද, තුන්වැනිව දැවී උණු වී ගිය රන් ආභරණද එකතු කරනු ලැබේ. මෙම ස්ථානය අසල සැරසිලි සහිතව අට්ටාලයක්ද ඉදිකරන ලැබේ. රාජකීය ගබඩාවේ සේවය කරන අයගෙන් තෝරාගත් පුද්ගලයෙකු සුදු රෙදි කඩකින් මුහුණ ආවරණය කර අළු පුරවන ලද මුට්ටිය හිස මත තබා ගෙන කඩුවක් අතැතිව දෝලාවක්/මැස්සක් මත තබාගෙන ගැලගම්බෝඩ ග්‍රාමයේ මිනිසුන් 04 දෙනෙකු විසින් ඔසවා ගෙන මහවැලි ගඟ දක්වා ගමන් කරයි. ගං ඉවුර අසලදී අට්ටාලයේ/මැස්සෙන් බසින භස්මාවශේෂ හා කඩුව රැගත් පුද්ගලයා ගඟ මැදට ගොස් ක්ෂණිකයෙන් තම අත තිබූ කඩුවෙන් භස්මාවශේෂ මුට්ටිය දෙකඩ කරනු ලැබේ. ඉන් අනතුරුව ඔහු විරුද්ධ ගං ඉවුර දෙසට පීනා ගොස් මාස 03 ක කාලයක් යනතුරු වනගත වී සිටියි. පිළිස්සුණු ඇටකටු හා උණුවී ගිය රත්තරන් ආභරණ මියගිය රජුගේ භස්මාවශේෂ වශයෙන් සලකා සොහොන් ගැබක තැන්පත් කරනු ලැබේ. ආදාහන මළුවේ අවමංගල්‍ය උත්සවය පැවැත්විය හැක්කේ අධිරාජයෙකු, රජකුමෙකු, මදු බිසව හා වැඩිමහල් සොයුරියකට පමණි. රජ පවුලේ අනෙකුත් සාමාජිකයන්ගේ අවමංගල්‍ය කටයුතු කරන්නේ උඩවත්ත කැලයේ රාම විහාරයට යාබද බණ්ඩාගේ තැන්න නම් ස්ථානයේය.

කීර්ති ශ්‍රී රජුගේ අවමඟුලට සහභාගි නොවූ කලඹුකේ පල්ලේගම රාළ හා ඔහුගේ පුතුයින් රාජ උදහසට ලක්වීමෙන් මහනුවරින් පලා ගොස් සැඟවී සිට ඇත. ඔවුන්ගේ දේපළ සියල්ල රාජසන්තක කරනලදී. පසුකලකදී නැවත මෙම දේපළ ආපසු දීමට පියවර ගෙන ඇත.


1825 වර්ෂයේදී හේබර් මැතිනියගේ (Mrs. Heber's Journal) සටහන් අනුව රාජසිංහ රජුගේ සොහොන් ගෙය කඩා මලසිරුරේ ඇටකටු එළියට ගත් බව සඳහන් වේ. සියලුම රාජකීය සොහොන් ගැබවල් විවෘත කිරීමේදී ඉතා වටිනා රත්තරන් හා ආභරණ මතුවී ඇත. එම සොහොන් කොත් හිමි ඇත්තේ ගෙඩිගේ පන්සලට යාබදවය. මෙම සොහොන් ගැබ ගලින් නිමකර තිබිණ. පසු කලකදී සිදුවූ කළු කෝලාහලවලදී සොහොන් ගැබ බලයෙන් විවෘත කිරීමේදී ඒවාට බරපතළ හානි සිදුව විනාශ වී ඇත.

''ෆෝබ්ස්, (Forbs) වාර්තා අනුව පළමුවැනි වෙළුම පිටුව 299 හි මෙසේ සඳහන් වේ.

17 වන ශත වර්ෂයේ රජ කළ රාජසිංහ රජු ආදාහන මළුව ආරක්ෂාවෙමින් 1828 මැයි දක්වා පැවතිනි. ඉන් පසුව 1937 කාලය වන විට සොහොන් ගැබවල ගල් ගැලවී පස් ගොඩවී අසල්වා ගොඩ ගැසුණු ස්ථානයක් බවට පත්වී තිබේ. මුතානයක් මහනුවරට ඇතුල්වීමේදී මෙම සොහොන් නොසැලකිලිමත්කම නිසා විනාශ වී ගොස් තිබූ නිසා ප්‍රතිසංස්කරණය කිරීමට තරම්වත් ප්‍රමාණවත් නොවිය. රජවරුන්ගේ සොහොන් ගැබ් අවසානයේදී පස්ගොඩවල් බවට පත්වී ඇත.

1878 - 80 කාලයේදී මහනුවර දුම්රිය මාර්ගය ආදාහන මළුවට යටින් දිවයන උමගකින් සකස් කරන ලදී. දුම්රිය මඟ සකස් කිරීමේදී ආදාහන මළුවේ ඉතිරිව තිබූ එක් සොහොන් ගැබක්ද දුම්රිය මාර්ගය ඉදිකිරීම නිසා විනාශ වී යන ලදී. දැනට එහි කිසිවක් දක්නට නැත. දක්නට ඇත්තේ කීර්ති ශ්‍රී රජුගේ තැම්පිය සොහොන් ගැබක වටරවුමක් වැනි උඩ කොටස හා කැඩී ගිය පියගැට පෙළ පමණි. ගෙඩිගේ විහාරයට පිටතින් පිහිටි බෝ ගහ පිහිටි ස්ථානයේ වීර වික්‍රමබාහු රජුගේ මෑණියන් ආදාහනය කළ ස්ථානය බව විශ්වාස කරයි. මෙය අඩි 06 ක් පමණ උස අඩි 20 ක වතු වටයක තාප්පයකින් යුක්ත වී ඇත. තාප්පයේ සිදුරු පහන් දැල්වීම හා මල් තිබීම සඳහා පාවිච්චි කර ඇත.

**ලයනල් විජේසුන්දර**
**ලේකම් - විදේශ සබඳතා ශ්‍රී දළදා මාළිගාව**




# අසිරිමත් උපසම්පදා කර්මය සිදුකරන හැටි



උපසම්පදා කර්මය සම්බන්ධයෙන් අද අනුගමනය කරනු ලබන බොහෝ සිරිත් විරිත් මහනුවර රජවරුන්ගේ කාලයේදී ආරම්භ කරන ලද බව ප්‍රකට කරුණකි. මේ සිරිත් විරිත් සියම් රටින් මෙරටට ගෙනෙන ලද්දේ වැලිවිට සරණංකර සංඝරාජයාණන්ගේ අනුග්‍රහය යටතේය.


"පෝය දවසක නම් සිංහල රජ කාලෙ තිබුණ නීතියේ හැටියට උපසම්පදා අපේක්ෂකයෙක් රජ කුමාරයෙක් වාගේ හොඳට ලස්සනට අන්දවලා දළදා මාලිගාවට යවනවා. දළදා මාලිගාවට යැව්වහම සිංහල රජ කාලේ නම් රජ්ජුරුවෝ ඇවිල්ලා මල් මිටුන්නක් තියලා ඒ තැනැත්තා පෙරහරෙන් වීදි සංචාරය කරවලා, අටපිරිකරතුත් දීලා විහාරයට එවනවා ඒ තැනැත්තා රජ්ජුරුවෝ වෙනුවෙන් 'වාහලතාග' නාමයෙන් උපසම්පදා කරන්ට කියලා. දැන් ඒ සිරිත වෙනුවට අපි එහෙම නායකයෙක් තෝරලා මාලිගාවට යැව්වහම ඒ තැනැත්තාට මිටුන්නක් තබලා දේවාල වටේ පෙරහැරකින් යවනවා. ඒ විහාර දෙකෙන්ම එන අය පෙරහැරකින් දේවාල වටේ ප්‍රදක්ෂිණා කරවලා නැවත විහාර දෙකටම යවනවා. එහෙම ආවයින් පස්සේ මහා සංඝයා වහන්සේලා පෝය ගෙට රැස්වෙලා, කර්මාචාර්ය වහන්සේලා පැමිණිලා ඒ ගිහි ඇඳුම ඉවත් කරලා, සාමණේර නමක් හැටියට ආයෙත් මහණ කරවනවා. එහෙම කරන්ට හේතුව

"මරුවාගෙන් පහර ලද්දවුන්ගේ රැකවරණය පිණිස පිය දරුවෝත් නැත. බෙලිරියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට පිහිට වීමට නොහැක."

මොකද, අර මහණ වෙච්ච සාමණේර නමක් වශයෙන් ඉන්න කාලෙදී යම්කිසි විදියකින් ඒ තැනැත්තා සිල විපත්තියකට හෙම පැමිණිලා හිටියා නම් ඒ තැනැත්තා උපසම්පදාවට සුදුසු නැති පුද්ගලයකු වෙන්න ඉඩ තියෙනවා. මේ තැනැත්තා අලුතෙන්ම මහණ කරවලා, දස සිල් දීලා, පිරිසිදුව ඉන්න අවස්ථාවේදී තමා උපසම්පදා කරවන්නේ. ඒ නිසා නැවත ඒ තැනැත්තා පැවිදි කරවනවා. පැවිදි කරලා, සිල් දීලා, ඊට පස්සේ 'නිස දෙනවා' කියලා කටයුත්තක් කරනවා. උපසම්පදා වෙච්ච භික්ෂූන් වහන්සේ කෙනෙකුට උපාධ්‍යායන් වහන්සේ කෙනෙක් අවශ්‍ය වෙනවා. ඒ උපාධ්‍යායන් වහන්සේ නියම කරලා, ඒ තැනැත්තා උපාධ්‍යායන් වහන්සේට බාර දෙනවා. මේකටයි 'නිස දෙනවා' කියලා කියන්නේ."

මහා විහාරයෙහි උපසම්පදාවක් පවත්වනු ලබන දවස එහි රැස්වී සිටින භික්ෂූන් වහන්සේලාට පමණක් නොව ගිහියන්ටත් විශේෂ අවස්ථාවකි. එදාට උපසම්පදාව අපේක්ෂා කරන සාමණේරයන් වහන්සේගේ දෙමව්පියෝත්, නෑදෑයෝත්, ගමේ දායකයෝත්, වෙනත් හිත මිතුරෝත් බොහොම උනන්දුවෙන් මහා විහාරයට රැස්ව මේ අවස්ථාවට සහභාගී වෙති. ඔවුන් මෙදා දක්ක ගැනීමට වඩාත්ම කැමති අවස්ථාව නම් උපසම්පදාපේක්ෂකයා රාජ කුමාරයෙකු මෙන් හැඳ පැළඳ සිටින අවස්ථාවයි. මේ ඇඳුම් හැඳ ගත් විට ඔහු හැඳින්වෙන්නේ 'නාගයා' යනුවෙනි. මේ මොහොතේදී ඔහු සැරසී සිටින්නේ කුමාරයකුගේ වෙසින් හෙයින්, මාල වැනි ආභරණ රාශියක්ද ඔහු පැළඳගෙන සිටියි.

"ඒ වෙලාවට, සීමාවට උපාධ්‍යායන් වහන්සේ ඇතුළුව සංඝයා වහන්සේලා රැස්වුණායින් පස්සේ ඒ උපසම්පදාපේක්ෂක



නම උපාධ්‍යායන් වහන්සේ ඉදිරියට කැඳවාගෙන එනවා කර්මාචාර්ය දෙනම විසින්. ආවහම ඒ උපසම්පදාපේක්ෂක නැනට නමක් දෙනවා. ඒ නම කර්මාචාර්ය දෙනම විසින් ඔහුට කියලා දෙනවා 'ඔබේ නම මෙන්න මේක' යි කියලා. ඊළඟට ඔහුට අයිති උපාධ්‍යායන් වහන්සේ නමකුත් තෝරලා දෙනවා 'ඔබේ උපාධ්‍යායන් වහන්සේ අසවලා' ය කියලා. මේ ඔක්කොම කෙරෙන්නේ පාලියෙන්."

"ත්වං නාගො නාම" (ඔබේ නම නාග.)

"ඔකාස අහං භන්තෙ". (එහෙයි.)

"තුය්හං උපජ්ඣායො තිස්සො තෙර නාම" (ඔබේ උපාධ්‍යායන් වහන්සේ තිස්ස තෙරණුවෝයි.)

"ඔකාස අහං භන්තේ" (එහෙයි.)

ඊට පස්සේ කර්මාචාර්ය දෙනම ඒ කර්ම වාක්‍යය කීම ආරම්භ කරති.

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස... පඨමං උපජ්ජං ආකාසෙ තබ්බො..."

උපසම්පදාව ලබන භික්ෂූන් වහන්සේට තමාගේම යැයි කිව හැකි පාත්‍ර සිවුරු තිබිය යුතුය.

"ණයට ඉල්ලගෙන ඇවිල්ලා තිබුණොත් උපසම්පදාව පිහිටන්නේ නෑ. ඒ නිසා තමයි අහන්නේ මේ පාත්‍රය තමුසෙගෙද? මේ උත්තරා සංඝය තමුසෙගෙද? මේ අඳනය තමුසෙගෙද? කියලා එකින් එක. ඒවා තමා සන්තක වුණොත් තමයි ඒ තැනැත්තාට උපසම්පදාව පිහිටන්නේ."

උපසම්පදා කර්මය අවසානයෙහිදී සංඝ සභාවෙහි සිටින කිසියම් දක්ෂ, ව්‍යක්ත භික්ෂූන් වහන්සේ නමක් විසින් අනුශාසනාවක් කරනු ලැබේ. උපසම්පදාව ලැබූ නම භික්ෂූන් වහන්සේලාගේ දැනගැනීම සඳහා පැවැත්වෙන මේ අනුශාසනාවෙන් කියවෙන්නේ උපසම්පදා ශීලය ආරක්ෂා කරගැනීමේ අවශ්‍යතාවයත්, ආරක්ෂා කරගත යුතු ආකාරයත්ය. මේ අනුශාසනාවෙන් පසු, පෝය ගෙයි කටයුතු නිමාවට පත්වෙයි.


සිය නිකායේ මූලස්ථානයෙහිදී මේ ආකාරයෙන් උපසම්පදාව ලබාගත් භික්ෂූන් වහන්සේ දන් ආපසු ගම් රට බලා පිටත් වෙති. මේ අවස්ථාවද ගමේ පන්සලේ උත්සව අවස්ථාවකි.


"මේ සඳහා ගමේ උපසම්පදා පෙරහරක් පවත්වනවා. ඒ පෙරහර සකස් කරන තුරු සමහර විට ඒ හාමුදුරුවෝ ළඟපාත පන්සලක නවත්වනවා. සියල්ල සූදානම් කළාට පස්සේ නියමිත ස්ථානයක ඉඳලා මහ පෙරහරකින් තමන්ගේ විහාරස්ථානයට වැඩම්මවාගෙන ගිහින් උත්සව සභාවක් පවත්වනවා. එතෙන්දී පළාතේ මහා සංඝයා වහන්සේලායි, ගමේ දායකයොයි, අසල්වැසියොයි ඔක්කොම එකතු වෙලා බොහොම අලංකාර විදියට පිළිගන්නවා. සමහර විට එදාම රාත්‍රියේ 'මඟුල් බණක්' එහෙමත් නැත්නම් 'පරිත්‍රාණ ධර්ම දේශනාවක්', පසුවදා මහා සංඝයා වහන්සේලාට දානයක් දීලා තමයි මේ උත්සවය අවසන් වෙන්නේ."

උපසම්පදාවෙන් පසු නියම භික්ෂුවක් බවට පත් වන සාමණේර නම, තවත් දස වසරක් ගතවුණු තැනේදී 'ථෙර' යන නාමට සුදුසු වෙයි. කිසියම් භික්ෂූන් වහන්සේ නමක් තෙරණුවෝ යනුවෙන් හැඳින්විය හැක්කේ උපසම්පදාවෙන් පසු දස වසක් අධිශීලයෙහි පිහිටා සිටියේ නම් පමණකි. මේ කාලය වන විට උන්වහන්සේ නොයෙක් නායක, අනුනායක, අධිකරණ නායක, මහා නායක ආදී පදවි හෙබවීමටද අත්‍යන්තයෙන්ම සුදුසු වන්නාහ.

මහාචාර්ය ජේ. බී. දිසානායක

ධර්ම සාකච්ඡාව





# ඉවසීමෙන් ලැබෙන සැනසීම

## පූජ්‍ය අකරැල්ලේ ඤාණවංශ හිමියන් සමග කළ සංවාදයකි

❒ ස්වාමීන් වහන්ස, ඉවසීම පිළිබඳ බෞද්ධ ආකල්පය කෙබඳුදැයි අප මුලින්ම හඳුනා ගනිමු?

ඉවසීම යන්නෙන් අදහස් වෙන්නේ අනායන් තමාට ක්‍රෝධ කරන විට, හිංසා පීඩාදිය සිදුකරන විට ඔවුන්ට පෙරළා ක්‍රෝධ නොකිරීමයි. බුදු දහමේ ඉවසීමට ප්‍රධාන තැනක් හිමිවෙනවා. බුද්ධත්වයට පත්වීමෙන් පසු මුල් විසි වස තුළ බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන්ට ඕවාද ප්‍රාතිමෝක්ෂය හෙවත් අවවාද ලබාදීම සිදුකළා. මෙහිදී ඉවසීම යන්න කැපී පෙනුණා. එහිදී "ඛන්ති පරමං තපො තිතික්ඛා" යන්නෙන් ඉවසීම උතුම් තපස් ගුණයක් බව කියැවුණා. ඉවසීම දියුණු කළ පුද්ගලයකු තමාට මෙන්ම අනුන්ටත් සෙත සලසන්නෙක් බව බුදුදහමේ දක්වෙනවා. දස පාරමිතාවන්හි ඉවසීම හෙවත් ඛන්ති පාරමිතාවට මුල් තැනක් හිමිවෙනවා.

බුදු දහමේ සැබෑ ඉවසීම පිළිබඳව මෙසේ සඳහන් වෙනවා.

"යො හවෙ බලවා සන්තො
දුබ්බලස්ස තිතික්ඛති
තමා හු පරමං ඛන්ති
නිච්චං ඛමති දුබ්බලො"

ඉන් පැහැදිලි වන්නේ යම් බලවත් කෙනෙක් දුබලයා් කෙරෙහි ඉවසයි නම් එයම උතුම් ඉවසීම වන බවයි. ඉවසීම සියලු ගුණධර්මයන්හි මූලික වශයෙන් බුදු දහමේ දක්වෙනවා. එනම් එකී ධර්මයන් ඉවසීම මුල් කොට ගෙන පවතින බවත්, වර්ධනය වන බවත් එනම්,

"සීලං සමාධි පඤ්ඤානං
ඛන්ති පධාන කාරණං
සබ්බෙපි කුසලා ධම්මා
ඛන්තයා යත්තනාව වඩ්ඪරෙ" යනුවෙනි.

මේ හැරුණු කොට මංගල සූත්‍රය, පරාභව සූත්‍රය වැනි සූත්‍ර දේශනාවන් බොහොමයක, පෙරදිග සාහිත්‍යයෙහි එන සුභාෂිතය, රාජවාලිකිය, ලෝකෝපකාරය වැනි කෘතිවලත් ඉවසීම පිළිබඳව සඳහන් වෙනවා. ඛන්තිවාදී ජාතකය, දිඝිති කෝසල ජාතකය, මහා කපි ජාතකය, සීලව නාග රාජ ජාතකය ආදී ජාතක කතාවන්හිද මේ පිළිබඳ අන්තර්ගත වෙනවා. පෙරදිග ආගමික චින්තනයෙහි ඉවසීමට වැඩි ඉඩක් හිමිවූ බව ශ්ලෝක පාඨ ඇසුරින් හෙළිවෙනවා.

❒ සැබැවින්ම ඉවසීමෙන් සැනසීමක් ලද හැකිද ස්වාමීන් වහන්ස?

මේ සමාජයේදී ගොඩනැගෙන සමාජ සම්බන්ධතා විවිධයි. ඒකාකාර ස්වරූපයක් දකින්න ලැබෙන්නේ නැහැ. එහිදී උගත් නූගත්, දුප්පත් පොහොසත් ආදී සැම තරාතිරමකම පුද්ගලයන් හා ආශ්‍රය කිරීමට අපට සිදුවෙනවා. ඒ නිසා සමාජයේදී නිරන්තරයෙන්ම අපට ක්‍රෝධයට, ද්වේශයට පත් කරවන සිදුවීම්වලට මුහුණ පෑමට සිදුවෙනවා. බස් රථයකට ගොඩවෙද්දීත්, බස් රථයේ ගමන් කරද්දීත්, ඉන් බසින අවස්ථාවේදීත් අපට ක්‍රෝධයට පත්වන දේවල් අනන්තවත් සිදුවෙනවා. මෙවන් අවස්ථාවලදී අප ඉවසීම පුහුණු කරලා, නැතිනම් ගැටුමක් ඇතිවීම වැළැක්වීමට හැකියාවක් නැහැ, ගැටුමට මුල්වූ කවර පාර්ශවයකටවත් ඉන් සැපයක්, සැනසීමක් ලැබෙන්නේ නැහැ. තමාට සතුරන් ඇතිවෙනවා. මෙවැනි කාරණා නිසා පුද්ගලයාගේ සැනසීම පිරිහී යන බව පෙනෙනවා. එය අනන්තවත් විපත්ති ඇතිවීමට හේතු කාරණා වෙනවා. ඉවසන්න පුරුදු වෙනවා නම් මේ ගැටලු අවම වෙනවා. ඉවසීමෙන් සැනසීම ලැබෙනවා යැයි කියන්නේ ඒ නිසයි.

❒ ඉවසීම පුහුණු කිරීමෙන් රෝගාබාධවලින් මිදීමට හැකි බවට මතයක් පවතිනවා. එය සත්‍යයක්ද?

එම සත්‍යයක් පවතිනවා. ඉවසීම යන්න පුළුල් අර්ථයෙන් ගත්විට සිත, කය, වචන යන තුන්දොර ඉවසීමෙන් යුතුව හික්මවා ගැනීම ලෙස හඳුනාගත හැකියි. වර්තමානයේ බහුලව පැතිරී ඇති රෝගාබාධ බොහොමයකට මූලික හේතුකාරණාව වී ඇත්තේ ඉවසීමෙන් තොර වීමයි. දියවැඩියාව, කොලෙස්ටරෝල් පමණක් නොව ඒඩ්ස් වැනි මාරාන්තික රෝගයන්ට ගොදුරු වීමට කායික ඉවසීම නොමැතිකම හේතුවක්. මේ හැර වත්මන් සමාජ ගැටලු බොහොමයකටත් ඉවසීම නොමැති වීම සඳින් බලපා ඇති බව හඳුනාගත හැකියි. යහපත් විවාහ සම්බන්ධතාවක් පවත්වාගෙන යාමටත්, ස්වාමි භාර්යා දෙදෙනා තුළ මනා ඉවසීමක් පැවතිය යුතුයි. සිඟාලෝවාද සූත්‍රයෙහි සැමියාගෙන් බිරිඳටත්, බිරිඳගෙන් සැමියාටත් යන දෙපාර්ශවයටම ඉටුවිය යුතු ප්‍රධාන යුතුකම් වශයෙන් දක්වෙන්නේ එකිනෙකාට සම්මාන කළ යුතු බවත්, අවමන් නොකළ යුතු බවත්. මෙහිලා ඉවසීම ප්‍රමුඛ වනවා. සමාජයේ දෙමාපිය දූ දරුවන් අතර මෙන්ම ඥාති හිත මිත්‍රාදීන් අතර, විවිධ සංකීර්ණ ගැටුම් ඇතිවීමටත් මේ තත්ත්වය පාදක වී ඇති බව හඳුනාගත හැකියි. යමෙක් ඉවසීමෙන් තොරව ක්‍රෝධ කරයි නම් ඔහුගේ ශරීරය දුර්වර්ණ වන බව මජ්ඣිම නිකායේ චූළ්ල කම්ම විභංග සූත්‍රයෙහි කියැවෙනවා. රූපලාවන්‍ය සඳහා අතිවිශාල මුදලක් වැය කරන වර්තමාන වෙළෙඳ සමාජයට ඉවසීම මනා ඖෂධයක් වෙනවා. ක්‍රෝධයෙන් තොරව ඉවසීම පුහුණු කරන්නේ නම් සිරුරේ ලේ ධාතුව පිරිසිදු වී ශරීරය පැහැපත් වෙනවා පමණක් නොවෙයි ලෙඩ රෝග රැසකින් අත්මිදෙන්නත් විශාල පිටුබලයක් වෙනවා.

❒ ඉවසීමෙන් පමණක් සැනසීමකට පත්විය හැකිද ස්වාමීන් වහන්ස?

යම් ගැටලුවකදී ඉවසීම පමණක්ම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඉවසනවා වගේම ගැටලුව විසඳීමට සුදුසු මග කුමක්ද? යන්නත් බුද්ධියෙන් වටහාගත යුතුයි. ඒ සඳහා ගත යුතු යහපත් ක්‍රියාමාර්ග ගත යුතුයි. වර්තමානයේ කෙනෙක් බරපතළ මානසික කඩා වැටීමක් පත්වූ විට එයට පහසු විසඳුම හැටියට ගන්නා පියවර වන්නේ සියදිවි නසාගැනීම. නමුත් එවැනි දුර්ලභ තත්ත්වයකට පත් නොවී ඉවසීමෙන් යුතුව බුද්ධිමත්ව ගත යුතු නිවැරදි පියවර පිළිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යයි.

ධර්ම ගවේෂක

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇලුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදාම සුවසේ නිදි පුබුදිති"

# සදහම් ප්‍රහේලිකා අංක - 83

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

**උපදෙස් :**

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, ශ්‍රීමත් එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය පෙබරවාරි 20 වැනිද බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තෝරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. තෑගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ▶ හරහට

1. ත්‍රිවිධ මානවලින් එකකි.
4. සිදුහත් කුමරුට නම් තැබීමට පැමිණි බමුණන්ගෙන් කෙනෙකි.
6. සඳකර පුදේශවල මෙබඳු මාර්ග දක්නට ලැබේ.
10. බුදු පුදයට ගෙන යති.
12. මෙබඳු විදුලි බලාගාරද අප රටේ ඇත.
13. සඳ මත මෙවා ඇති බව පැරැන්නෝ විශ්වාස කළා.
14. භික්ෂූන් නොවූවෝත් මේ අයද මුදුන් සරණ ගියහ.
15. මෙබඳු නමින් ව්‍යවහාර වන පිරිස්ද මෙරට වාසය කරති.

### ▼ පහළට

2. පින කළ ඇත්තෝ මරණින් පසු මෙබඳු ලෝකවල උපදිති.
3. ගාලු දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා ගංගාවකි.
5. ආර්ය සත්‍යයින් එකකි.
7. ඉදිකිරීම් කටයුතු සඳහා මෙවාද අවශ්‍ය වෙයි.
8. අද ලුම්බිනිය අද හඳුන්වන්නේ කුමන නමකින්ද?
9. අංගුලිමාලගේ මව් නැමිනිය.
10. සත්බුදුවරුන්ගෙන් කෙනෙකි.
14. ධාන්‍ය වර්ගයකි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 ද | | 3 | | ■ | 4 | 5 |
| ■ | | ■ | 6 | ර් | 7 | ■ | |
| 8 | ■ | 9 | ■ | 10 | | | |
| | ■ | | ■ | | ■ | 11 | ■ |
| න් | ■ | 12 | | ■ | 13 | | ■ |
| | ■ | | ■ | 14 | ■ | ස් | ■ |
| | ■ | ■ | ■ | 15 ල | | | ■ |

### ප්‍රහේලිකා අංක 81 ජයග්‍රාහී වාසනාවන්තයෝ

- **සුජාතා නලුගස්කුඹුර**
  147, හියංගොඩ,
  කුඹුරේගම.
- **කුමුදිනී රාජපක්ෂ**
  දෙණිපහගෙදර, අලවල,
  අම්බකොටේ.

---

## ඔබත් දළදා වරුණට ලියන්න

දළදා වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දහයකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමු. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.


සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න
  www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

## කුල දරුවන් හතර දෙනෙකු සසුන්ගත කෙරේ

**යටිනුවර,** ගෝන්නදෙණිය පුරාණ විහාරාධිපති මැද්දේගොඩ ඉන්දසාර අම්බුළුපුර බෝධිරුක්ඛාරාමාධිපති, නියෝජ්‍ය විදුහල්පති, තම්බිට විමලසාර, මැලේසියාවේ පදිංචි ගෝන්නදෙණියේ චන්දවිමල, එළදත්තේ සංඝරක්ඛිත යන හිමිවරුන්ගේ ආචාර්යත්වයෙන් හා යටිනුවර, කඩුගන්නාව ඉල්ලදෙර පුරාණ පොත්ගුල් විහාරාධිපති, යටිනුවර ප්‍රධාන සංඝනායක, ශාස්ත්‍රපති මීවල සෝරත නාහිමිගේ ප්‍රධානත්වයෙන් හා මල්වතු මහා විහාරයේ දෙහෙදෙණියේ රතනසාර සංඝරාජ පරිවේණාධිපති මල්වතු මහා විහාර සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික තැන්නකුඹුරේ පියදස්සි යන හිමිවරුන්ගේ උපාධ්‍යායයෙන් කුල දරුවන් හතර දෙනෙකු කුඩමාදුවේ ප්‍රඥාසාර, වැටකේපොත නන්දසාර, වැටකේපොත ඉන්දවිමල, කොස්ගොඩ සීලවිමල යන පැවිදි නමින් පසුගියද සසුන් ගත කෙරුණි.

**කේ. බණ්ඩාරනායක**



# කෙලෙස් තවන නුවණ

බ්‍රාහ්මණ සමාජයේ පැවැති ඇතැම් ව්‍රත සමාදානය බුදු දහමේ පහළවීමත් සමග වෙනස් විය. එකල භාරතීය සමාජයේ පැවැති ව්‍රත වෙනුවට බෞද්ධ සමාජය තුළ කෙලෙස් තවන නුවණ යන අර්ථයෙන් ධූතාංග සමාදානය භික්ෂූන් වහන්සේලා අතර ප්‍රචලිත විය. එම කෙලෙස් ධූතාංග පිළිබඳ කෙටි විවරණයකි මේ.

ධූතාංග යනු කෙලෙස් නැසීම සඳහා රකිනු ලබන අංග වේ. ඒවා 13 කි.

1. පාංශු කූලිකාංගය

අවමංගල්‍ය කෘත්‍යයක ආගමික වතාවත් කිරීමේදී මළගිය තැනැත්තාට පින් පිණිස පූජ්‍ය පක්ෂයට පිරිනමන වස්ත්‍රය නැතහොත් එම අවස්ථාවේ භික්ෂූන්ට පූජා කරන සුදු රෙද්ද මතක වස්ත්‍ර එකතු කර මසා ගන්නා සිවුරෙන් පමණක් සිටීම පාංශුකූලිකාංගයයි. අතීතයේ මළ මිනී ඔතා දමන ලද කසළ ගොඩෙන් අහුලා ගත් මඩ හා වැලිවලින් ගැවසුණු වස්ත්‍රය පාංශුකූල නම් විය. එවැනි වස්ත්‍රවලින් කළ සිවුරු පමණක් දරීමයි.

2. තෙචීවර කාංගය

භික්ෂූන් වහන්සේලාට අනුමත තනිපට සිවුර (සංඝාටිය), දෙපට සිවුර (අන්තරා සංඝය), අඳන කඩය (අන්තරවාසිකය) යන සිවුරු තුන පමණක් දරීමයි හෙවත් ප්‍රයෝජනයට ගැනීමයි.

3. පිණ්ඩපාතිකාංගය

ආහාර පිඬු වශයෙන් පාත්‍රයට ලබාගෙන පිඬු සිගා යාමෙන් ලත් ආහාර පමණක් වැළඳීම.

4. සපදාන චාරිකාංගය

ගෙපිළිවෙළින් පිණ්ඩපාත චාරිකාවේ වැඩම කිරීමයි. භික්ෂුව පිඬු සිගා යාමේදී ආසන්නයේ ඇති ගෙවල්වලට යාමේදී අතරක් නැතිව අනුපිළිවෙළට පිඬු සිගා වැඩම කිරීමයි. (පිණ්ඩපාත චාරිකාවේ හැසිරීම)

5. ඒකාසනිකාංගය

ඉරියව් පැවැත්වීමේදී එකම ආසනයක් පමණක් භාවිත කිරීම. යම්කිසි ආසනයක් හිඳ ගැනීමට මෙන්ම සයනය කිරීමටත් භාවිතා කිරීමයි. උදේ දානය වැළඳීමට යොදගත් ආසනයම දහවල් දානය සඳහා යොද ගැනීම.

6. පත්ත පිණ්ඩිකාංගය

පාත්‍රයට ලැබෙන යම් රසවත් හෝ නීරස වූ ආහාර වෙනත් භාජනයක නොදමා පාත්‍රයේම වැළඳීම.

7. ආරඤ්ඤිකාංගය

ජනගහනය සහිත සෙනසුනක නොරැඳී කැලෑවකට ගොස් හුදෙකලාව භාවනා කිරීමයි.

8. රුක්ඛ මූලිකාංගය

සෙනසුනක රැඳී නොසිට ගසක් මුල ඇසුරු කොටගෙන බණ භාවනා කිරීමයි.

9. අබ්භෝ කාසිකාංගය

ආවරණය නොවූ ස්ථානයක එනම්, එළිමහනෙහි වාසය කරමින් අව්ව, වැස්ස, මැසි මදුරු පීඩා ඉවසමින් බණ භාවනා කිරීමයි.

10. සෝසා නිකාංගය

මළමිනී පුළුස්සා දමන ලද හෝ සතුන්ට කෑමට මළමිනී දමා ඇති සුසාන භූමිවල සිට භාවනා කිරීමයි.

11. යථා සන්තතිකාංගය

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ට පළමු කොට ලැබුණ සෙනසුනෙහිම වාසය කරමින් රකින ධූතාංගයයි.

12. නේසජ්ජිකාංගය

දිවා රාත්‍රී දෙකෙහිම නොනිද භාවනා වැඩීමය.

13. ඛලු පච්ඡා භත්තකාංගය

ගිලනකුට දී ඉතිරි වූ ආහාර නොවැළඳීම. උදේ දානය බෙදන විට අතින් පාත්‍රය වැසුවේ නම් පසුදින වනතුරු ආහාර නොවැළඳීම යන කෙලෙස් ධූතාංගය වේ.

ශාක්‍ය ඉඳුවර ගුණසේකර

“[illegible] උත්තමයෙකි.”

සර් ඇත අතීතයේ අවුරුදු ලක්ෂයකට පරමායුෂ තිබුණ කාලයක මුහුරති නමින් බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වී සිටියා. මේ බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටින කාලයේදී සසරේ මහා බලගතු කුසල් කර සක්විති රජකම ලබාගත් ප්‍රභාවන්ත නමින් සක්විති රජ කෙනෙක් සිටියා. බුදු කෙනෙකුන් පහළ වී සිටින කාලයක සක්විති රජකමක් ලබා සිටීමට නොහැකි වූ ධර්මතාවයක් ලොව පැවතෙනවා. ඒ නිසා සක්විති රජ කෙනෙක් සිටියත් බුද්ධත්වයට පත් බුදුකෙනෙක් සිටින විට සක්විති රජකම නොහැරදා මහණවිය යුතු වෙනවා. ඒ නිසා ප්‍රභාවන්ත සක්විති රජතුමාද තමා සතු සියලු ධනය දන්දීලා විශාල පිරිසක් සමග ගෙස් මුහුරති නම් බුදුරජාණන් වහන්සේගෙන් මහණ උපසම්පදාව ලබාගෙන පැවිදි වුණා. එදා උන්වහන්සේගේ පැතුම වූයේ ලොව්තුරා බුදු පදවිය ලබාගැනීමයි. මාර්ගඵල නිවන් අවබෝධ කරගැනීමට කිසිදු අපේක්ෂාවක් උන්වහන්සේ තුළ තිබුණේ නැත. උන්වහන්සේ කළේ පිණ්ඩපාතය කරගෙන විත් සෙසු ස්වාමීන් වහන්සේලාට දානය පූජා කිරීමයි. කිසිම දිනක අලස බවක් නැතිව, පුදුම ශ්‍රද්ධාවකින් මේ සංඝ උපස්ථානය කළා. මේ සත් ක්‍රියාව ගැන භික්ෂූන් වහන්සේලා අතර නොයෙක් කථා බස් ඇතිවුණා. එක් දිනක් මුහුරති බුදුරජාණන් වහන්සේ දම් සභා මණ්ඩපයට වැඩ භික්ෂු සංඝයා අමතා මෙසේ වදාළා.

"මහණෙනි, මෙම රත්න ස්ථවිරයන් වහන්සේ එසේ මෙසේ කෙනෙක් නොවෙයි. මෙතුමා දීර්ඝ කාලයක් බුදු බව පතාගෙන එන, පාරමී පුරන බුද්ධාංකුරයෙක්. මේ ස්වාමීන් වහන්සේ මෙතැන් සිට සොළසා සංඛ්‍ය කල්ප ලක්ෂයකට පසුව මෛත්‍රී නමින් ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයට පත්වෙනවා. ඒ කාලයේදී මුනිවහන්සේගේ මව්පිය දෙපළ වන්නේ සුබ්‍රහ්ම සහ බ්‍රහ්මවතී යන දෙදෙනායි. අවුරුදු අසූ දහසක් පරමායුෂ ඇති මුනිවහන්සේ චන්ද්‍රමුඛී නම් කුමාරිකාවක් සමග විවාහ වී අට දහසක් අවුරුදු ගිහි සැප විඳිනවා. චන්ද්‍රමුඛී බිසවුන් වහන්සේට පුත් රුවනක් ලැබුණුදාට සතර පෙරනිමිති දකලා මාලිගාවත් සමගින් අභිනිෂ්ක්‍රමණය කරනවා. බ්‍රහ්ම රාජයකු විසින් පිළිගන්වන ලද අටපිරිකර හැද, පොරවාගෙන පැවිදි වෙනවා. තමන් වහන්සේගේ ගිහි කාලයේදී අගබිසව වූ චන්ද්‍රමුඛී රජ බිසව අතින්ම පූජා කරන කිරිපිඩු දානය පිළිඅරගෙන දින හතක් දුෂ්කර ක්‍රියාව සිදුකරලා, සියලු කෙලෙසුන් නසා උතුම් වූ සර්වඥතා ඥානය ලැබ මෛත්‍රී නමින් ලොව්තුරු බුද්ධත්වයට පත්වෙනවා. එසේම බ්‍රාහ්මණවරු, ගෘහපතිවරු, ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර ආදී හැම වංශයකින්ම පැමිණ මෛත්‍රී බුදු සසුනෙහි පැවිදි වෙනවා. එසේ පැවිදි වෙන 20 අසංඛ්‍ය හැට කෝටි පනස් ලක්ෂයක් පමණ ජනතාව සංසාර දුකින් එතෙර වෙනවා" කියා මෙම වටිනා ධර්ම දේශනාව විස්තර කර පහදා දී වදාළා.

ඉන් අනතුරුව උන්වහන්සේ වදාළේ මගේ ශාසනයේ සිටින භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසට ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, බලයෙන්, ප්‍රඥාවෙන් දියුණු වීමට හේතුවන ඡන්ද, චිත්ත, වීර්ය, විමංසා කියන සතර සෘද්ධිපාද වැඩීමටත්, එසේම සියලු භව භෝග සම්පත් ලැබීමට හේතුවන මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා කියන ගුණයන් වැඩීමටත්, සතර සතිපට්ඨාන වැඩීමටත් රැස්ව සිටින දිව්‍ය, බ්‍රහ්ම මනුෂ්‍යාදීන්ට අනුශාසනා කළා. මේ ධර්ම ශ්‍රවණයෙන් පසුව භික්ෂූන් වහන්සේලා විසිදහසක් දෙනා රහත් භාවයට පත්වී වදාළා. එසේම පැමිණි ලක්ෂ ගණන් බෝධියන් මග ඵල නිවන් අවබෝධ කරගන්නා, අහස පුරා රැඳී සිටිය දිව්‍ය, බ්‍රහ්මයින්ද ඇතුළු විශාල පිරිසක් මග ඵල නිවන් අවබෝධ කරගන්නා.

මෙම බුද්ධ දේශනාවෙන් පෙනී යන්නේ විශ්වයේ තිබෙන සියලුම ලෞකලෝක කාලයකදී විනාශ වී යන බවත් පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මහා භූත සතර එක්වීමෙන් නැවත ලෞකලෝක සැදෙන බවත්, මිනිසා විසින් කරන ලද කුසලාකුසල බලයෙන් හා තෘෂ්ණා, අවිද්‍යා හේතුවෙන් නැවත නැවත ඉපිද ඉපිද සසර සැරිසරන බවත්, ලෝකවාසී සත්වයන්ගේ සන්තානවල අකුසල් උත්සන්න වීම නිසා ඔවුන් විසින්ම ඔවුන්ගේ පරිහානිය, විනාශය සිදුකර ගන්නා බවත්, කුසල ධර්ම වඩන විට දියුණුව සහ ආරක්ෂාව ලැබෙන බවත් දේශනාවෙන් පැහැදිලි වෙනවා.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව අවුරුදු 2500 ක් මේ වනවිටත් ගෙවී අවසානයි. දන් දන් ලෝකය පුරා මිනිස් සමාජයේ වර්ධනය වෙමින් පවතින ස්ත්‍රී දූෂණ, මිනීමැරීම්, මංකොල්ලකෑම්, ක්‍රෝධය, වෛරය, ඊර්ෂ්‍යාව, බොරුව, වංචාව, සොරකම් සහ වෙනත් විවිධ ආරවුල් නිසා මිනිස් සමාජය පරිහානියට යන බව පැහැදිලිව පෙනෙනවා. අද සිටින බෞද්ධයෝ බොහෝ දෙනෙක් මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දක, නිවන් දැකීමට ප්‍රාර්ථනා කරනවා. ඒ පැතුම ඉටුකර ගන්නටත් අවුරුදු අසංඛ්‍ය ගණන් ගෙවන්නට වෙනවා. ඒ පැතුම ඉටුකර ගන්නට ලැබුණොත් ලැබෙන්නේ අද පවන් හම තමන් ලබාගත් මනුෂ්‍ය ජීවිතයේ අවසානය දක්වා නිරතුරුව දාන, සීල, භාවනාදී දස කුසල් කිරීමෙන් පමණක් බව අප සෑම දෙනාම වටහාගත යුතු වෙනවා. මේ මහා භද්‍ර කල්පයේදී බුදුවන අන්තිම බුදුරජාණන් වහන්සේගේ ශාසනයේදීවත් නිවන් අවබෝධ කරගැනීම ගෙනම බුදු සසුනෙන් වැඩ නොගත් පිරිස කල්පනා කළ යුතු වෙනවා.

සාමවිනිසුරු පී. බුද්ධදාස



# අනාගතයේදී ලොව පහළවන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ගැනයි මේ